සමාජ ව්‍යවසාය අත්පොත

Funded by the European Union

care

Chrysalis
Catalyzing change

BRITISH COUNCIL

Lanka Social Ventures
Supporting entrepreneurship & innovation for social change

සමාජ ව්‍යවසාය අත්පොත

අපට ලෝකය වෙනස් කර
එය වඩාත් හොඳ තැනක් කළ හැකිය.
වෙනසක් කිරීම ඔබ සතුය.

නෙල්සන් මැන්ඩෙලා

බ්‍රිතාන්‍ය කවුන්සිලය විසින් යුරෝපා හවුලේ
ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩසටහනේ 'එන්ටර්ප්‍රයිස්' ව්‍යාපෘතිය
අනුග්‍රහයෙන් ප්‍රකාශයට පත් කරන ලදී.
ලංකා සෝෂල් වෙන්චර්ස් සමාගම විසින් සම්පාදනය කරන ලදී.

Funded by the European Union
In collaboration with the Government of Sri Lanka
care
Chrysalis Catalyzing change
BRITISH COUNCIL
Lanka Social Ventures

බ්‍රිතාන්‍ය කවුන්සිලයේ ප්‍රකාශනයකි

BRITISH COUNCIL

බ්‍රිතාන්‍ය කවුන්සිලය
49, ඇල්ෆ්‍රඩ් හවුස් ගාඩ්න්ස්
කොළඹ 03

ප්‍රථම මුද්‍රණය 2022

© 2022 by British Council
All rights reserved

ISBN : 978-624-5548-11-8

අප සැමට ජීවත් වීමට
වඩා යහපත් ශ්‍රී ලංකාවක් ඇති කිරීමට
වෙහෙස මහන්සි වන
සියලූම සමාජ ව්‍යවසායකයන් වෙත
මෙම ප්‍රකාශනය පිරිනමන්නෙමු

පටුන

පෙරවදන vii

පිළිගැන්වීම viii

මෙම අත්පොත කා සඳහාද? 1

01 පරිච්ඡේදය - සමාජ ව්‍යවසායයන් හඳුනාගැනීම 3

02 පරිච්ඡේදය - සමාජ ව්‍යවසායයන්ගේ ප්‍රධාන ලක්ෂණ 8

03 පරිච්ඡේදය - විවිධ සමාජ ව්‍යවසාය ව්‍යාපාර ආකෘති 18

04 පරිච්ඡේදය - සමාජ ව්‍යවසායක් ආරම්භ කරන්නේ කෙසේද? 22

05 පරිච්ඡේදය - සමාජ ව්‍යවසායයක් ආරම්භ කිරීමේ පියවර 26

06 පරිච්ඡේදය - සමාජ ව්‍යවසාය අදහස් ජනනය කිරීම,
තෝරා බේරා ගැනීම සහ ඇගයීම 39

07 පරිච්ඡේදය - සමාජ ව්‍යවසාය පිහිටුවීමට සැලසුම් කිරීම.................................. 57

08 පරිච්ඡේදය - සමාජ බලපෑම යනු කුමක්ද සහ ඔබ අදහස් කළ බලපෑම,
ඔබ සාක්ෂාත් කර ගෙන ඇත්දැයි දැන ගන්නේ කෙසේද? 69

සමාජ ව්‍යවසායකයින් සඳහා වැඩිදුර තොරතුරු සහ ඉගෙනුම් මූලාශ්‍ර 71

WELCOME to the 2012 SOCIAL ENTERPRISE CONFERENCE
"Go out into the world and do well. But, more importantly, GO INTO the WORLD & DO GOOD"
SHARED value
where FINANCIAL RETURN & SOCIAL IMPACT INTERSECT
NEVER UNDERESTIMATE SIMPLICITY
I DO IT BECAUSE I LOVE IT
NON/FOR PROFIT HYBRID (SHARED VALUE)
AWARENESS of WASTE LEADS to REDUCTION of WASTE
A BALANCE of ENTREPRENEURIAL SPIRIT & ADVICE
INNOVATION
INCLUSION
IMPACT
TEST NEW IDEAS
PARTNERSHIPS
COLLABORATION
HOW WILL YOU WORK TOGETHER?
INTERSECTIONS
LOOK FOR OPPORTUNITY in the INBETWEEN
LEADERSHIP
WHAT'S WORKING?
TRANSPARENCY
SUCCESSFUL SOCIAL ENTREPRENEURS
SOCIAL IMPACT BONDS will only WORK WHEN YOU HAVE PROVEN SOCIAL PROGRAMS
IT IS POSSIBLE to SCALE with PHILANTHROPIC DOLLARS
take the RISK NOW
CONTINUOUS IMPACT MEASUREMENT
FEEDBACK
SCALE
HELP YOUR FRIENDS BE AS COURAGEOUS AS YOU
YOU HAVE THE POWER TO KEEP THE ENGINE GOING
PATH to SCALE ISN'T ALWAYS CLEAR
BE VULNERABLE
BE POWERFUL
THINK SIMPLE
PARTNERSHIP
PASSION
FAIL FAST & ITERATE LEARN TRY AGAIN
WHEN EVERYONE IS A CHANGEMAKER WE ALL BENEFIT/ WE NEED TO PROMISE OURSELVES THAT WE WILL HELP EVERYONE GET THERE
INNOVATION INCLUSION IMPACT
FERTILE TERRITORY for SOCIAL ENTERPRISE INNOVATION
EXPAND the BOUNDARIES of ECONOMIC MARKETS TO INCLUDE MARGINALIZED POPULATIONS
GLOBAL FORCE LOCAL CITIZEN
WELL+GOOD
PROVIDING GRAPHICS, PROCESS DESIGN & FACILITATION

පෙරවදන

සමාජ ව්‍යවසායකත්ව සංකල්පය ශ්‍රී ලංකාව තුල ප්‍රචලිත කිරීමට බ්‍රිතාන්‍ය කවුන්සිලය 2013 සිට විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. මෙහි එක් සංධිස්ථානයක් ලෙස 2017 වර්ෂයේදී යුරෝපා සංගමයේ ආධාර මත ක්‍රියාත්මක කිරීම ආරම්භ කළ 'එන්ටර්ප්‍රයිස්' ව්‍යාපෘතිය හැඳින්විය හැක. මෙම ව්‍යාපෘතිය කෙයාර් ජර්මන් (Care Germany) ආයතනය, ක්‍රිසලිස් (Chrysalis) සහ බ්‍රිතාන්‍ය කවුන්සිලය (British Council) එක්ව ක්‍රියාත්මක කෙරිණි.

මෙම ව්‍යාපෘතිය යටතේ බ්‍රිතාන්‍ය කවුන්සිලය සමාජ ව්‍යවසාය සම්බන්ධ වැඩසටහන් මාතලේ, නුවරඑලිය, බදුල්ල සහ මොනරාගල දිස්ත්‍රික්කවල දියත් කළ අතර සමාජ ව්‍යාපාර සංකල්පය ව්‍යවසායකයින් හට හඳුන්වාදීම, සමාජ ව්‍යාපාර ආරම්භ කිරීමට දිරිගැන්වීම මෙන්ම සමාජ ව්‍යාපාර ප්‍රගමනයට අවශ්‍ය වටපිටාවක් ඇතිකිරීමට කටයුතු කරන ලදී. වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී ව්‍යවසායකයින්, සමාජ ව්‍යවසායකයින්, ව්‍යාපාර ආරම්භ කිරීමට බලාපොරොත්තුවන්නන් මෙන්ම රාජ්‍ය සහ රාජ්‍ය නොවන ආයතනවල නිලධාරීන් රැසක් සහභාගී කර ගන්නා ලදී.

මෙම "සමාජ ව්‍යවසාය අත්පොත"සමාජ ව්‍යවසායකත්ව සංකල්පය පිළිබඳ දැනුම තවදුරටත් ලබාගැනීමට අපේක්ෂිත පරිශීලකයින් ඉල්ලක්ක කරගෙන එළිදක්වන ලදී. මෙහි අන්තර්ගත සමාජ ව්‍යවසාය සිද්ධාන්ත, සංකල්ප සහ අනෙකුත් තොරතුරු ශ්‍රී ලංකාව තුළ සමාජ ව්‍යවසායකයින් බිහිකිරීමට සහ සවිබලගැන්වීමට හේතු පාදක වන බව නොවනුමානයි.

සංජීවනී මුණසිංහ

වැඩසටහන් ප්‍රධානී - බ්‍රිතාන්‍ය කවුන්සිලය

පිළිගැන්වීම

මෙම සමාජ ව්‍යවසාය අත්පොත සකස් කිරීමේ වගකීම අපහට පැවැරීම පිළිබඳවත්, මේ සඳහා දැක්වූ සහයෝගය පිළිබඳවත් බ්‍රිතාන්‍ය කවුන්සිලයට සහ එහි වැඩසටහන් ප්‍රධානී සංජීවනී මුණසිංහ මහත්මිය ඇතුළු සමාජ ව්‍යවසාය කණ්ඩායමට අපගේ ස්තුතිය පිරිනමන්නෙමු.

පසුගිය වසර හත තුළ ශ්‍රී ලංකාවේ සමාජ ව්‍යවසායයන් හා කටයුතු කිරීමේදී අප ලබාගත් දැනුම හා පළපුරුද්ද මෙම අත්පොත සැකසීමේදී මහඟු ලෙස ප්‍රයෝජනවත් විය.

මෙම අත්පොත සෑම ව්‍යවසායෙකුටම තම සමාජ ව්‍යවසාය ආරම්භ කිරීමේදී සහ පවත්වාගෙන යාමේදී ඉටුකළ යුතු දේවල් පිළිබඳව ඉතා සරල ලෙස විස්තර කර ඇත. මෙය සෑම ව්‍යවසායෙකුටම ප්‍රයෝජනවත් වනු ඇතැයි අපි විශ්වාස කරමු.

ආචාර්ය ලලිත් වෙලමැදගේ
කළමණාකාර අධ්‍යක්ෂ සහ ප්‍රධාන විධායක
ලංකා සෝෂල් වෙන්චර්ස් සමාගම

Lanka Social Ventures
Supporting entrepreneurship & innovation for social change

මෙම අත්පොත කා සඳහාද?

මෙම අත්පොත ඔබට හෝ ඔබේ සංවිධානයට නව සමාජ ව්‍යවසායක් ආරම්භ කිරීමට හෝ සංවර්ධනය කිරීමට අවශ්‍ය මූලික දැනුම ලබා දෙයි. නව සමාජ ව්‍යවසායයන් දියුණු කිරීමට උපකාර කිරීම කෙරෙහි මෙම අත්පොත අවධානය යොමු කර ඇතත් මෙය විශේෂයෙන් ම ප්‍රයෝජනවත් වනුයේ:

- සමාජ හෝ පාරිසරික අරමුණක් සඳහා ව්‍යවසායක් ආරම්භ කිරීමට අපේක්ෂා කරන පුද්ගලයන් හෝ පුද්ගල කණ්ඩායම්වලට
- සමාජ ව්‍යවසායක් බවට පරිවර්තනය වීමට අපේක්ෂා කරන ස්වේච්ඡා සංවිධාන, ප්‍රජා සංවිධාන සහ නිෂ්පාදන කණ්ඩායම්වලට
- සමාජ ව්‍යවසාය නැවත උත්පාදනය කිරීමට හෝ තම ප්‍රජාව සඳහා රැකියා උත්පාදනය කිරීමට සුදුසු ක්‍රමයක් දැයි ගවේෂණය කරන ප්‍රජා කණ්ඩායම් හෝ සංවිධාන
- තම ප්‍රජාවේ සමාජ හා ආර්ථික සුභ සිද්ධිය ඇතිකිරීම සඳහා ගැළපෙන ක්‍රමවේද ගවේෂණය කරන ප්‍රජා කණ්ඩායම් හෝ සංවිධානවලට
- සමාජ ව්‍යවසායයන් සඳහා උපදෙස් හෝ මාර්ගෝප සපයන උපදේශකවරුන් හට

මෙම අත්පොත ඔබේ සමාජ ව්‍යවසාය ආරම්භ කිරීම සඳහා පියවරෙන් පියවර ප්‍රවේශයක්, ඉතා සරල ලෙස ඉදිරිපත් කරන අතර ව්‍යවසාය සැලසුම් කිරීම පිළිබඳ ව මූලික දැනුමක් ලබා දීමට උත්සාහ කරයි. මෙම අත්පොත ඕනෑම ව්‍යවසායකයෙකු, ප්‍රජා කණ්ඩායමක්, හෝ ස්වේච්ඡා සංවිධානයක් සඳහා හොඳ කළමනාකරණ මෙවලමක් වශයෙන් භාවිතා කළ හැක.

1 සමාජ ව්‍යවසායයන් හඳුනාගැනීම

සමාජ ව්‍යවසාය යනු කුමක්ද?

සමාජ ව්‍යවසාය යනු ලෝකය යහපත් ලෙස වෙනස් වෙනස් කිරීමට උත්සාහ දරන ව්‍යාපාර සංවිධාන ලෙස හැඳින්විය හැක. සාම්ප්‍රදායික ව්‍යාපාර මෙන් සමාජ ව්‍යවසායයන්ද ලාභ ඉපැයීම අරමුණු කරන නමුත් ඔවුන් පැහැදිලි ලෙස වෙනස් වෙන්නේ ඔවුන්ගේ ලාභයෙන් ඔවුන් කරන දෙයයි. එනම් ධනාත්මක සමාජ වෙනසක් ඇති කිරීම සඳහා ලබන ආදායමේ අතිරික්තයෙන් හෝ ලාභයෙන් කොටසක් හෝ සම්පූර්ණ වශයෙන් තම සමාජ හෝ පාරිසරික අරමුණු ඉටු කර ගැනීම සඳහා නැවත ආයෝජනය කිරීමයි. එසේ නැත්නම් පරිත්‍යාග කරයි, සමාජ ව්‍යවසායයන් ඕනෑම ප්‍රජාවක, එනම් ග්‍රාමීය හෝ නාගරික ප්‍රජාවන් තුළ ක්‍රියාත්මක කළ හැක.

වෙළඳපලේ භාණ්ඩ හා සේවා විකිණීමෙන්, සමාජ ව්‍යවසායයන් රැකියා උත්පාදනය කරන අතර ඔවුන්ගේ ලාභය ඔවුන්ගේ ව්‍යාපාරයට සහ තම ප්‍රජාවගේ උන්නතිය සඳහා නැවත ආයෝජනය කරයි. මෙය ඔවුන්ට සමාජ ගැටලු විසඳීමට, මිනිසුන්ගේ ජීවන අවස්ථා වැඩි දියුණු කිරීමට, වෙළඳපළෙන් දුරස්ථ අයට පුහුණුව සහ රැකියා අවස්ථා ලබා දීමට, ප්‍රජාවන්ට සහාය වීමට සහ පරිසරය ආරක්ෂා කිරීමට ඉඩ සලසයි.

සමාජ ව්‍යවසායයන් විවිධ ක්ෂේත්‍ර වල ක්‍රියාත්මක වේ. විශේෂයෙන්ම කෘෂිකාර්මික, ධීවර සහ සමුද්‍රීය, පාරිභෝගික භාණ්ඩ සහ සේවා සහ ආහාර පාන නිෂ්පාදනය සහ බෙදා හැරීම, සෞඛ්‍ය සහ සමාජ ආරක්ෂණ සේවා, පරිසර ආරක්ෂණය, ප්‍රතිචක්‍රීකරණය සහ අධිචක්‍රීකරණය, විකල්ප බලශක්ති ජනනය, සංස්කෘතික විවිධත්වය සහ උරුමය ආරක්ෂා කිරීම, අධ්‍යාපනය, ළමා සුරැකුම්, ජාතීන් සහ සමාජ සමානාත්මතාවය, සහ තොරතුරු සහ සන්නිවේදනය යන ක්ෂේත්‍ර වල සමාජ ව්‍යවසායයන් බහුලව දැකිය හැක.

තවද, සමාජ ව්‍යවසායයන් විශේෂයෙන්ම සමාජයේ විශේෂිත වූ මෙන්ම ආන්තික කණ්ඩායම් කෙරෙහි වැඩි අවධානයක් යොමු කර ඇත. මෙම කණ්ඩායම් අතරින් ජ්‍යෙෂ්ඨ පුරවැසියන්, ළමුන්, තනි මව්වරුන්, ආබාධිත පුද්ගලයින්, හිටපු රැඳවියන්, සහ අඩු ආදායම්ලාභීන් සමාජ ව්‍යවසායයන්ගේ විශේෂ අවධානයට ලක් වී ඇති අතර ඔවුන් සඳහා භාණ්ඩ හා සේවා සැපයීම පිණිස සමාජ ව්‍යවසායන් ආරම්භ කර සාර්ථකව ක්‍රියාත්මක කර ඇත.

සමාජ ව්‍යවසාය යනු ලෝකය යහපත් ලෙස
වෙනස් කරන ව්‍යාපාර වේ. සම්ප්‍රදායික ව්‍යාපාර
මෙන් ඔවුන් ලාභ ඉපැයීම අරමුණු කරන නමුත්,
ඔවුන් සම්ප්‍රදායික ව්‍යාපාර වලින් වෙනස් වන්නේ
ඔවුන්ගේ ලාභයෙන් කරන දෙයයි.
එනම් ධනාත්මක සමාජ වෙනසක් ඇති කිරීම
සඳහා ඵලදායී ලෙස නැවත යෙදවීමයි.

Social Enterprise UK

සමාජ නවෝත්පාදන (Social Innovations)

සමාජ නවෝත්පාදන යනු යම් සමාජමය අවශ්‍යතාවයක් හෝ සමාජය වෙනසක් සඳහා නව නිෂ්පාදන, සේවා සහ ආකෘති අදහස් නිර්මාණය කිරීමයි.
මෙම නව සංකල්ප අපේ සමාජයට සහ පරිසරයට මුල්තැන දෙන පවතින සමාජ, සංස්කෘතික, ආර්ථික සහ පාරිසරික අභියෝග විසඳීමට උපකාරී වේ.
සමහර සමාජ නවෝත්පාදන යම් පවත්නා පද්ධති සහ ක්‍රමවේද නව්‍යකරණය කරයි එසේත් නැතිනම් ස්ථිර ලෙස වෙනස් කරයි.

ශ්‍රී ලංකාවේ සමාජ ව්‍යවසායයන්

ශ්‍රී ලංකාවේ සමාජ ව්‍යාවසායයන් වලට දීර්ඝ ඉතිහාසයක් ඇති අතර එය මහනුවර දිස්ත්‍රික්කයේ ප්‍රථම සමුපකාර සමිතියේ උපත සිදු වූ 1904 දක්වා ඈතට දිව යයි. කාලයාගේ ඇවෑමෙන් විවිධ නම්වලින් හැඳින්වුව ද, වාණිජ කටයුතු සිදු කරන සමාජ සංවිධාන රටේ සමාජ-ආර්ථික සංවර්ධනය සඳහා විශාල කාර්යභාරයක් ඉටු කර ඇත. මෙම ක්ෂේත්‍රයේ දියුණුව සඳහා විවිධ රජයන් හි සමාජ සුබසාධන ප්‍රතිපත්ති වැදගත් කාර්යභාරයක් ඉටු කර ඇත.

බ්‍රිතාන්‍ය කවුන්සිලය විසින් 2018 කරන ලද ශ්‍රී ලංකාවේ සමාජ ව්‍යවසායයන් පිළිබඳ අධ්‍යයනයට අනුව සමාජ ව්‍යවසාය ලක්ෂණ සපුරාලන සංවිධාන සංඛ්‍යාව ආසන්න වශයෙන් 11,000 ක් ලෙස ගණන් බලා ඇත. සමාජ ව්‍යවසායයන් අනෙකුත් ව්‍යාපාරවලට මෙන්ම ඔවුන්ගේ ම විශේෂිත අභියෝගවලට මුහුණ දිය හැකි ය. පසුගිය වසර පහ තුළ, රට තුළ ජනප්‍රිය නව ව්‍යාපාර රැල්ලක් බවට පත් වෙමින් සමාජ ව්‍යවසායයන් කැපී පෙනෙන ප්‍රගතියක් දක්වා ඇත.

ශ්‍රී ලංකාවේ සමාජ ව්‍යවසාය අංශය ප්‍රධාන වශයෙන් පහත සඳහන් සංවිධාන සහ පුද්ගලයන්ගෙන් සමන්විත වේ.

- සිවිල් සමාජ සංවිධාන
- නිෂ්පාදන සංවිධාන
- සමුපකාර සමිති
- දේශීය රාජ්‍ය නොවන සංවිධාන
- වෘත්තීය සංවිධාන
- පළමු සහ දෙවන පරම්පරාවේ පවුල් ව්‍යාපාර
- කුඩා සහ මධ්‍යම පරිමාණ ව්‍යවසායයන්
- නව පරම්පරාවේ ව්‍යවසායකයින් සහ නවෝත්පාදකයින්

ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ සමාජ ව්‍යවසායයන්

2 සමාජ ව්‍යවසායන්ගේ ප්‍රධාන ලක්ෂණ

සමාජ ව්‍යවසායන්හි පොදු සහ විශේෂිත වූ ලක්ෂණ කිහිපයක් ඇත. සමාජ ව්‍යවසායයන්ගේ වැදගත්ම ලක්ෂණය වන්නේ ඔවුන් මිනිසුන්ගේ ජීවිත හෝ පරිසරය වැඩිදියුණු කිරීම අරමුණු කරගනිමින් සමාජ සහ පාරිසරික ගැටළු ආමන්ත්‍රණය කිරීමට කටයුතු කිරීමයි. ඒ අනුව ඔවුන් සමාජීය සහ පාරිසරික අරමුණු තම ව්‍යාපාරික අරමුණු සමග ඒකාබද්ධ කරමින් ව්‍යාපාර පවත්වාගෙන යයි. සම්ප්‍රදායික ව්‍යවසායන් මෙන් නොව සමාජ ව්‍යවසායකයින් අරමුණු කරන්නේ අයිතිකරුවන්ට සහ කොටස් හිමියන්ට ලාභ ඉපැයීමට වඩා සමාජ බලපෑම සාක්ෂාත් කර ගැනීමයි. තවද ඔවුන් සමාජ බලපෑම ලාභයට වඩා වැදගත් කොට සලකයි.

සමාජ ව්‍යවසායයන්හි ප්‍රධාන ලක්ෂණ වනුයේ:

- ආර්ථික බලපෑමට වඩා සමාජ බලපෑම වැදගත් කොට සලකයි.
- ලාභයෙන් වැඩි ප්‍රමාණයක් ව්‍යවසායයේ සමාජ අරමුණු මත නැවත ආයෝජනය කෙරේ.
- සමාජ සහ පාරිසරික ගැටළු ආමන්ත්‍රණය කරයි, එනම්, ඔවුන් ප්‍රජාවන් හෝ මිනිසුන්ගේ ජීවිත වැඩිදියුණු කිරීම හෝ පරිසරය ආරක්ෂා කිරීම අරමුණු කරයි.

සමාජ ව්‍යවසායන්හි පහත ලක්ෂණද ඇත

- නිශ්චිත සමාජ අරමුණු - Explicit social objectives
- මූල්‍ය සංයුතිය - Funding composition
- අවදානම් ව්‍යවර්ථනය - Risk aversion
- පරිමාව - Scale
- සමාජ ව්‍යවසායකත්වය - Social entrepreneurship
- සම්බන්ධ වන පුද්ගලයන් සහ ආයතන - Stakeholders
- ශ්‍රම ආයෝජනය - Sweat equity

සමාජ ව්‍යවසායයක් සාර්ථක වීමට බලපාන සාධක

සාර්ථක ව්‍යවසායක ගුණාංග තිබීම

පැහැදිලි සාමාජීය සහ ව්‍යාපාරික අරමුණු තිබීම

සවිමත් සහ ප්‍රබෝධමත් නායකත්වයක් තිබීම

ඉලක්ක කණ්ඩායමට සහ වෙළඳපලට ගැලපෙන ලෙස ව්‍යාපාරය සකස්වීම

නිෂ්පාදනය කරන භාණ්ඩය හෝ සේවාව අන් අයට ප්‍රයෝජනවත් වීම

මනා ව්‍යාපාරික සහ සාමාජීය අන්තර් සම්බන්ධතා පවත්වා ගැනීම

සවිමත් ව්‍යාපාර ව්‍යුහයක් සහ කලමනාකරණ ක්‍රමවේදයක් තිබීම

මූල්‍ය කටයුතු පිළිබඳව දැඩි ග්‍රහණයක් සහ මූල්‍ය විනයක් තිබීම

ලාභදායීවීම සහ තිරසර පැවැත්ම

අළුත් දේවල් ඉගෙනීමට ඇති කැමැත්ත

විවෘත හා විනිවිද භාවය

නවෝත්පාදන සංස්කෘතියක් තිබීම

සමාජ ව්‍යවසායක් යනු කුමක්ද?

සමාජ හෝ පාරිසරික ගැටළුවක් ආමන්ත්‍රණය කරයි

රැකියා සහ ආදායම් උත්පාදනය කරයි

උපයාගත් ආදායම් සමාජ අරමුණු මත නැවත ආයෝජනය කරයි

මිනිසුන්ගේ ජීවන තත්ත්වය නංවාලයි

සමාජ ව්‍යවසායකයින් සහ සම්ප්‍රදායික ව්‍යවසායකයින් අතර ඇති වෙනස

සම්ප්‍රදායික ව්‍යවසායකයා

ලාභ අපේක්ෂාවෙන් අවදානමක් දරා යම් වාණිජ කාර්යයක් සඳහා මූල්‍ය ආයෝජනයක් කරන තැනැත්තා

සමාජ ව්‍යවසායකයා

සමාජ හෝ පරිසර ගැටළුවක් ආමන්ත්‍රණය කිරීමේ අරමුණෙන් අවදානමක් දරා යම් වාණිජ කාර්යයක් සඳහා මූල්‍ය ආයෝජනයක් කරන තැනැත්තා



ව්‍යාපාර ලෝකයේ සමාජ ව්‍යවසාය ස්ථාන ගත වී ඇති අයුරු

සමාජ ව්‍යවසායයන් සහ සමාජ ව්‍යවසාය නිර්මාතෘවරුන් ව්‍යාපාරික ලෝකයේ ඉතා වැදගත් කොටසක් ලෙස සැලකිය හැක. එමනිසා ව්‍යාපාරික ලෝකයේ සමාජ ව්‍යවසායයන් ස්ථානගතවී ඇත්තේ කුමන ස්ථානයේදැයි හඳුනාගත යුතුය. ව්‍යාපාරික ලෝකයේ ප්‍රධාන සංවිධාන වර්ග කිහිපයක් ඇත. ඒවා නම් ලාභය අරමුණු කරගත් සංවිධාන (profit-oriented organisations), ලාභය ඉලක්ක කරගත් ආයතනික සමාජ වගකීම් සහිත සංවිධාන (corporate social responsiblility), වාණිජ ක්‍රියාකාරකම් තුළින් ආදායම් උපදවන ලාභ නොලබන සංවිධාන (income generating non-profit) සහ ලාභ නොලබන සංවිධාන (non-profit). මේ අනුව සමාජ ව්‍යවසායයන් දෙමුහුන් සංවිධානයක් (hybrid) ලෙස සලකනු ලබන්නේ ලාභය ලබන සහ ලාභ නොලබන ආයතන දෙකෙහිම ලක්ෂණ ඇති බැවිනි. පහත රූප සටහන මඟින් සමාජ ව්‍යවසායයන් ව්‍යාපාරික ලෝකයේ ස්ථානගත වී ඇත්තේ කොතැනද යන්න පෙන්වයි.



ප්‍රකට සමාජ ව්‍යවසායයන් සහ ඒවායේ නිර්මාතෘවරුන් පිළිබඳ උදාහරණ කිහිපයක්

බයෝලයිට් එනර්ජි, නිව්යෝර්ක්, ඇමරිකා එක්සත් ජනපදය
Bio-Lite Energy, New York, United State of America

සමාජ නවෝත්පාදකයා

ඇලෙක් ඩ්‍රමන්ඩ් සහ ජොනතන් සිඩර් යන ඉංජිනේරු උපාධිධාරීන් දෙදෙනා විසින් 2006 දී ආරම්භ කරන ලද මෙම සමාජ ව්‍යවසාය මගින් බලශක්ති අඩුවෙන් භාවිතා කරන ආලෝකකරණ සහ ඉවුම් පිහුම් උපකරණ නිෂ්පාදනය කර අලෙවි කරයි.

හඳුනාගත් සමාජ ගැටලුව

ලෝකයේ සංවර්ධනය වෙමින් පවතින රටවල්වල අඩු ආදායම් ලබන ජනතාව නිවෙස් ආලෝක කිරීම සහ ආහාර පිසීම සඳහා සාමූහිකව වාර්ෂිකව වියදම් කරන මුදල ඩොලර් බිලියන 27 පමණ වේයැයි අනුමාන කෙරේ. ලෝකයේ බිලියන 3ක් පමණ ජනතාවක් ආහාර පිසීම සඳහා තවමත් දැව භාවිතා කරති. ගෘහස්ථ ආහාර පිසීමේදී ඇතිවන දහන දුමෙන් මිලියන 4 ක් ශ්වසන සහ හෘද ආශ්‍රිත රෝග වලින් පීඩා විඳිති. බිලියන 2.5 ක ජනතාවකට තවමත් ගෘහස්ථ විදුලි පහසුකම් නැත.

සමාජ විසඳුම සහ බලපෑම

BioLite ඉන්ධන මෙන්ම දව භාවිතයෙන් පිරිසිදු, ආරක්ෂිත සහ පහසු ලෙස ආහාර පිසීම සඳහා උසස් බලශක්ති නිෂ්පාදන සංවර්ධනය කර නිෂ්පාදනය කරන අතරම ජංගම දුරකථන සහ LED ආලෝකකරණ උපකරණ වලට විදුලි බලය ආරෝපණය කිරීමටද හැකිය. BioLite නිෂ්පාදන 50,000 පමණ රටවල් 23ක අලෙවි කර ඇත. පුද්ගලයන් 1,785,509 ක් දැන් BioLite නිෂ්පාදන හරහා පිරිසිදු බලශක්තිය ජනනය කරමින් භාවිතා කරයි.

අර්ත්බවුන්ඩ් ක්‍රියේෂන්ස්, බෝවල, මහනුවර
Earth Bound Creations, Bowala, Kandy

සමාජ නවෝත්පාදකයා

Earth Bound යනු මහනුවර තරුණයෙකු වූ සාගර ලියනගේ විසින් 2013 දී ආරම්භ කරන ලද සමාජ ව්‍යවසායක් වන අතර එය ප්‍රතිචක්‍රීකරණය කරන ලද පරණ පුවත්පත් කඩදාසි යොදා අතින් සාදන ලද අත්කම්, කඩදාසි පැන්සල්, කඩදාසි හස්ත කර්මාන්ත, කඩදාසි බෑග් සහ තවත් බොහෝ දේ නිෂ්පාදනය කරයි. ව්‍යාපාරය සමාජ ව්‍යවසාය ආකෘතියක් ලෙස ක්‍රියාත්මක වන අතර එහි දී සේවකයින් තම නිවසේ සිටම වැඩ කරන අතර කාන්තාවන්ගේ ආදායම් මාර්ග සුරක්ෂිත කරමින් සහ ග්‍රාමීය තරුණ තරුණියන් සවි බල ගන්වමින් සාදන ලද නිෂ්පාදන ව්‍යාපාරයට විසින් අලෙවි කරයි.

හඳුනාගත් සමාජ ගැටලුව

පරිසර දූෂණය විසඳිය යුතු ගැටලුවක් ලෙස හඳුනා ගෙන ඇත. ඊට අමතරව තම ප්‍රජාව තුළ දිළිඳු සහ අඩු ආදායම්ලාභී පවුල් කිහිපයක් සිටින බවත් බොහෝ කාන්තාවන් රැකියා සොයා මැදපෙරදිගට සංක්‍රමණය වන බවත් ඔහු හඳුනා ගෙන ඇති අතර මෙය මෙම ප්‍රජාව තුළ විශාල සමාජ ප්‍රශ්නයක් වී තිබේ.

සමාජ විසඳුම සහ බලපෑම

ආරම්භයේ දී පුද්ගලයන් 3 දෙනෙකු පමණක් සේවයේ යොදවා ආරම්භ කරන ලද මෙම ව්‍යවසාය 2021 වන විට ශිල්පීන් 700 කට අධික සංඛ්‍යාවක් සේවය කරයි. සාර්ථකත්වයේ ප්‍රධාන ලක්ෂණය වන්නේ නිෂ්පාදනවලට ආවේණික වූ සුවිශේෂී ශ්‍රී ලාංකේය නිර්මාණ රසයයි. නුපුහුණු අයගේ සිට අර්ධ නිපුණතා මෙන්ම දක්ෂ වෘත්තිකයන් දක්වා දේශීය දක්ෂතා යොදවා අපද්‍රව්‍ය භාවිතයෙන් කෙරෙන සමස්ත නිෂ්පාදන ක්‍රියාවලියම පරිසර හිතකාමී වේ. ඉතාලිය, එක්සත් රාජධානිය, ඇමරිකා එක්සත් ජනපදය, ඕස්ට්‍රේලියාව, කටාර්, ජර්මනිය, හොංකොං, මාලදිවයින සහ නෙදර්ලන්තය යන රටවලට අපනයනය කරමින් විදේශ විනිමය රටට උපයා දෙයි.

අඩු මිල සනීපාරක්ෂක තුවා, කොයිම්බටූර්, ඉන්දියාව
Low-cost Sanitary Pads, Coimbatore, India

සමාජ නවෝත්පාදකයා

අරුණාචලම් මුරුගානන්දම් මහතා පාසල හැර ගිය අයෙකි, පසුව වෙල්ඩින් වැඩපලක සහායකයෙකු ලෙස රැකියාවක් සොයා ගත්තේය. සමාජ ව්‍යවසායකයෙකු ලෙස ඔහු අඩු වියදම් සනීපාරක්ෂක තුවා සාදන යන්ත්‍රයක නිපැයුම්කරු වන අතර ග්‍රාමීය ඉන්දියාවේ ඔසප් වීම සම්බන්ධ සාම්ප්‍රදායික අපිරිසිදු පිළිවෙත් පිළිබඳව දැනුවත් කිරීම සඳහා බිම් මට්ටමේ යාන්ත්‍රණ නවීකරණය කිරීමේ ගෞරවය හිමි වේ. ඔහුගේ කුඩා යන්ත්‍රවලට, වෙළඳපලේ පවතින මිලෙන් තුනෙන් එකකට වඩා අඩු මුදලකට සනීපාරක්ෂක තුවා නිෂ්පාදනය කළ හැකිය.

හඳුනාගත් සමාජ ගැටලුව

ඉන්දියාවේ කාන්තාවන්ගෙන් 88% ක් තම ඔසප් කාලය තුළ විවිධ සනීපාරක්ෂක නොවන ක්‍රම භාවිතා කිරීමට පෙලඹී ඇත. මෙම අපිරිසිදු පිළිවෙත් හේතුවෙන්, කාන්තාවන්ගෙන් 70% කට වඩා වැඩි ප්‍රමාණයක් ප්‍රජනක ආසාදනවලින් පීඩා විඳිති, ඒ ආශ්‍රිත පිළිකා වැළඳීමේ අවදානම වැඩි කරයි.

සමාජ විසඳුම සහ බලපෑම

අරුණාචලම් මුරුගානන්දම්, කාන්තා සනීපාරක්ෂාව පිළිබඳ විප්ලවීය වෙනසක් සිදු කර ඇති අතර බොහෝ දුරට ග්‍රාමීය ඉන්දියාවේ කාන්තාවන්ගේ සෞඛ්‍ය සහ ජීවනෝපාය කෙරෙහි කල්පවත්නා බලපෑමක් ඇති කර තිබේ. ඔහුගේ පේටන්ට් බලපත්‍රලාභී අඩු වියදම් සනීපාරක්ෂක තුවා සෑදීමේ යන්ත්‍ර දැරිය හැකි පහසු මිලකට ලබා ගත හැකිය. මේ වන විට ඉන්දියාවේ ප්‍රාන්ත 23 ක සහ රටවල් 10 කට අධික ප්‍රමාණයක මෙම යන්ත්‍ර දහසකට වඩා අලෙවි කර ඇත.

හවුස් ඔෆ් ලොනාලි
House of Lonali, Sri Lanka

සමාජ නවෝත්පාදකයා

තරුණ විලාසිතා නිර්මාණ ශිල්පිනියක සහ කාන්තා සමාජ ව්‍යවසායකයෙකු වන ලොනාලි රොද්‍රිගෝට සැමවිටම අවශ්‍ය වූයේ ලෝකය යහපත් කිරීමට උපකාරී වන දෙයක් කිරීමට ය. ලොනාලි නිර්මාණකරුවෙකු බවට පත් වූ පසු, පරිසරය කෙරෙහි ධනාත්මක බලපෑමක් ඇති කිරීම සඳහා ඇයගේ කුසලතා සහ නිර්මාණශීලීත්වය භාවිතා කළ හැකි විවිධ ක්‍රම පිළිබඳව ඇය ක්‍රියාශීලීව සොයා බැලුවාය. හවුස් ඔෆ් ලොනාලි යනු මිනිසුන් සහ පෘථිවිය යන දෙකම හදවතේ තබා ගනිමින් සම්මුති විරහිත විලාසිතා සහ විලාසිතාවන් නිර්මාණය කරන සවිඥානික ජීවන රටා සන්නාමයයි. ලොනාලි විශ්වාස කරන්නේ සෑම දෝෂයක් තුළම අද්විතීය අලංකාරයක් ඇති අතර කාලයත් සමඟ අප කරන කුඩා තේරීම් අනාගතය යහපත් ලෙස වෙනස් කිරීමට හැකියාව ඇති බවයි. හවුස් ඔෆ් ලොනාලි ශ්‍රී ලංකාවේ පුරෝගාමී අධිචක්‍රීයකරණ (upcycle) සන්නාමය ලෙස අපතේ යන රෙදිපිළි භාවිතා කරමින් අද්විතීය විලාසිතා භාණ්ඩ චක්‍රාකාර මනසකින් මිනිසුන්ට සහ පෘථිවියට ධනාත්මක බලපැමක් ඇතිකරන අතරම නිෂ්පාදනයේ දී සහ පරිභෝජනයේ දී ඇතිවිය හැකි ඍනාත්මක බලපෑම අවම කරයි.

හඳුනාගත් සමාජ ගැටලුව

ශ්‍රී ලංකාව එහි වර්ධනය වන සදාචාරාත්මක ඇඟලුම් කර්මාන්තය සඳහා ප්‍රසිද්ධය. එය අපනයන ආදායමට මෙන්ම රටේ ශ්‍රම බලකායට ද දායක වේ. පරිභෝජනයට පෙර කර්මාන්තයෙන් ඉවතලන අනවශ්‍ය රෙදිපිළි අපද්‍රව්‍ය අමු ද්‍රව්‍ය ලෙස භාවිතා කිරීමට සහ එයින් හොඳ අනාගතයක් සැලසුම් කිරීම ලොනාලිගේ ප්‍රයත්නයයි.

සමාජ විසඳුම සහ බලපෑම

ව්‍යවසායයේ ප්‍රධාන සම්පත වන්නේ පෙර පාරිභෝගික අපද්‍රව්‍ය (ප්‍රධාන වශයෙන් රෙදිපිළි) වන අතර, කුණු ගොඩවල්වල හෝ පුළුස්සා දැමීමට ලක් විය හැකි සියලුම රෙදිපිළි අපද්‍රව්‍ය ගණනය කෙරේ. මේ වන විට රෙදිපිළි අපද්‍රව්‍ය කිලෝග්‍රෑම් 3,862ක් නැවත භාවිත කර විලාසිතා භාණ්ඩ 18,362ක් නිෂ්පාදනය කර ඇත. පුද්ගලයින් 15,730 ක් දෙනෙක් අතර සාකච්ඡා, වැඩමුළු සහ පුහුණු වැඩසටහන් මගින් දැනුම බෙදා ගෙන තිබේ.

කන්ටලා සමාගම, ශ්‍රී ලංකාව
Kantala, Sri Lanka

සමාජ නවෝත්පාදකයා

විකුම් රාජපක්ෂ සහ නදිශාන් ශාන්තිකුමාර් විසින් 2013 දී ආරම්භ කරන ලද කන්ටලා සමාගම වසර 300 කට අධික පැරණි දුම්බර හණ පැදුරු වියන ශිල්පයේ ආභාෂය ලත් තිරසාර වීගන් (vegan) විලාසිතා සන්නාමයකි. ප්‍රතිජනනය කරන හණ ශාක, Fair Trade සහතික කරන ලද අත්‍යන්ත්‍ර සහ Pinatex වැනි ස්වභාවික තන්තු සත්ව මාංශ නිෂ්පාදන වලින් තොර හා තිරසාර ද්‍රව්‍ය පමණක් භාවිතා කරමින්, කන්ටලා කාන්තා ටෝට් බෑග්, ක්ලච් බෑග්, පසුම්බි සහ උපාංග රැසක් පිරිනමයි. කන්ටලා සිය සන්නාමගත නිෂ්පාදන සැලසුම් කිරීම, මූලාශ්‍ර කිරීම, සන්නාමගත කිරීම, අලෙවිකරණය සහ විකිණීමේ නිරත වන අතර සියලුම බාහිර නිෂ්පාදන කටයුතු ශ්‍රී ලංකාවේ ගෘහ, ක්ෂුද්‍ර සහ කුඩා ව්‍යවසායන් විසින් සිදු කරයි. සෑම කන්ටලා නිෂ්පාදනයක්ම මිනිසුන්ට සහ පෘථිවියට හිතකර බව සහතික කරනු ලැබේ.

හඳුනාගත් සමාජ ගැටලුව

ග්‍රාමීය සහ අවදානමට ලක්විය හැකි ප්‍රජාවන් සඳහා සාධාරණ ආර්ථික අවස්ථා නිර්මාණය කිරීමට උපකාරී වන සම්ප්‍රදායික සහ දේශීය ශිල්ප ක්ෂේත්‍රවල අස්පෘශ්‍ය සංස්කෘතික වත්කම් රාශියක් ශ්‍රී ලංකාව සතුව ඇත. එසේම ශතවර්ෂ ගණනක වටිනා දේශීය දැනුම ද රැගෙන මෙම ශිල්ප බොහෝමයක් වඳ වී යාමට ආසන්නව පවතී. මෙම සාම්ප්‍රදායික සහ දේශීය අත්කම් සමකාලීන, උසස් තත්ත්වයේ සහ සුවිශේෂී නිෂ්පාදනවලට අනුවර්තනය කිරීමෙන්, කාන්තාවන්, තරුණයින් සහ අනෙකුත් ආන්තික ප්‍රජාවන්ට ආරක්ෂිත සහ ගෞරවනීය ජීවනෝපායක් ලබා දීම කන්ටලා අරමුණු කරයි. එසේම, කන්ටලා පාරිභෝගිකයින්ට වගකීමෙන් යුත්, උසස් තත්ත්වයේ සහ හොඳින් සැලසුම් කර ඇති විලාසිතා උපාංග සඳහා මිනිසුන්ට සහ පෘථිවියට හානිකර නොවන විකල්පයක් සපයයි.

සමාජ විසඳුම සහ බලපෑම

දුම්බර හණ පැදුරු සාම්ප්‍රදායික ශිල්පීන් සමඟ සමීප සහයෝගීතාවයෙන් කටයුතු කරන කන්ටලා, සමකාලීන මෝස්තර සහ ගුණාත්මක ප්‍රමිතීන්ට අනුකූල වන අද්විතීය තිරසාර වීගන් විලාසිතා උපාංග පෙළක් නිෂ්පාදනය කිරීමට හැකි සැපයුම් දාමයක් එක් කර ඇත. අතින් වියන ලද දුම්බර හණ පැදුරු සමඟ ඒකාබද්ධ වූ සැපයුම් දාමයක් නිර්මාණය කරමින්, කන්ටලා පාරම්පරික ශිල්පීන්ට හණ පැදුරු ගෙතීම පිළිබඳ විශේෂඥ දැනුමක් ලබා දී ඇති අතර, ඔවුන්ට උසස් තත්ත්වයේ පැදුරු නිෂ්පාදනය කිරීමටත් එමගින් ඉහළ ජීවන වැටුපක් උපයා ගැනීමටත් හැකි වේ. ඒ අතරම සාමාන්‍ය වයස් මට්ටම් ද රැගෙන එම අංශයට තරුණ දක්ෂතා ආකර්ශනය කර ගැනීමට කන්ටලා සමත් වී ඇත.

3 විවිධ සමාජ ව්‍යවසාය ව්‍යාපාර ආකෘති

සමාජ ව්‍යවසායයන් සමාජ ගැටලු සඳහා විවිධ ව්‍යාපාරික විසඳුම් ගෙන එයි. අවසාන ඉලක්කය වන්නේ ප්‍රදාන සහ පරිත්‍යාග මත පමණක් රඳා නොසිට නව්‍ය ක්‍රමවලින් මූල්‍යමය තිරසාරත්වය ළඟා කර ගැනීමයි. එම නිසා සමාජ ව්‍යවසායයෙන් ලැබෙන ලාභය සම්පූර්ණයෙන්ම හෝ ඉන් කොටසක් සංවිධානයේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා නැවත ආයෝජනය කිරීමට හැකියාව ලැබේ.

ව්‍යාපාර ආකෘතියක ප්‍රධාන අංග දෙකක් ඇත:

1. සංවිධානයේ අපේක්ෂිත බලපෑම නිර්මාණය කිරීම සඳහා තීරණාත්මක වන අභ්‍යන්තර ආයතනික ව්‍යුහය සහ බාහිර හවුල්කාරිත්වයන් ඇතුළත් මෙහෙයුම් උපාය මාර්ගයක්
2. සංවිධානය තම කාර්යය කිරීමට අවශ්‍ය සම්පත් (මූල්‍ය සහ මානව) ලබා ගන්නේ කොහෙන්ද, කෙසේද සහ කුමන කොන්දේසි මතද යන්න නිර්වචනය කරන සම්පත් උපාය මාර්ගයක්,

සමාජ ව්‍යවසායක ව්‍යාපාර ආකෘතිය යනු යෙදවුම් ප්‍රතිඵල බවට පරිවර්තනය කරන නාලිකාවයිග සමාජ වටිනාකම (මැනිය හැකි බලපෑම) සහ ආර්ථික වටිනාකම (ආදායම) යන දෙකම උත්පාදනය කරන ආකාරය පවසන ආකෘතියයි.

විසිවන (20) පිටුවේ සාරාංශ කර ඇති විවිධ වර්ගයේ සමාජ ව්‍යවසාය ව්‍යාපාර ආකෘතීන් ආයතන, වැඩසටහන් හෝ සේවා සැපයීම සඳහා සමානව යෙදිය හැක. මෙම ආකෘති නිර්මාණය කර ඇත්තේ සමාජ ව්‍යවසායන්ගේ මූල්‍ය හා සමාජ අරමුණු, මෙහෙවර, වෙළඳපල, සේවාදායක අවශ්‍යතා හෝ හැකියාවන් සහ නීතිමය පරිසරයට අනුකූලවය. බොහෝ ව්‍යාපාරික ආකෘති සංවිධානය තුළ අන්තර්ගත වන පරිදි සකස් කර ඇත.


INTRO TO BUSINESS MODEL THINKING AS A STRATEGY TOOL
Alex Osterwalder @business_design
Jan. 26 2012
San Francisco
#bmgen
Business Model Generation
The STORY of the BOOK
2004
Dissertation... got downloaded!
Let's write a book!
A best-seller!
BUT... There are LOTS of books already...
...with lots of TEXT.
Let's make it VISUAL!
We want to help write the book!
WORLDWIDE ADOPTION!
1958 INVENTION OF THE PHOTOCOPIER
There's NO Market.
We'll lease the machine... and charge for copies.
XEROX
WHAT DID THEY DO?
1. EMPOWER PRODUCT through BUSINESS MODEL
2. INVENT a NEW BUSINESS MODEL
3. TAKE a RISK - EXPERIMENT
Nespresso
Swiss spending on coffee is UP 600% (2 yrs)
...what is their business model?
1994
SEARCH ENGINES
Make money from FREE?
Buy the search term!
Experience = high end
More money from pods
Own distribution channel
Patented pods
Elegant customer experience
WHAT IS A BUSINESS MODEL?
ECOSYSTEM - ORGANISM
CONTINUAL PROCESS
FORMULA ONE CAR
FEATURES INTO ADVANTAGES
HOLISTIC LOOK @ BUSINESS
DELIVERS VALUE
Blah blah blah
TOWER OF BABEL
BACK STAGE
FRONT STAGE
BUSINESS MODEL CANVAS
BUSINESS MODEL ≠ ORG CHART
Business Model Portfolios
@ninmah | Rachel Smith

ව්‍යාපාර ආකෘතිය Business Model	එය ක්‍රියාත්මක වන ආකාරය How it works	උදාහරණ Examples	ප්‍රධාන සාර්ථක සාධක Key Success Factors
අඩු ආදායම්ලාභී සේවාදායකයා Low-income client	සේවාදායකයින්ට සේවා සැපයීම සම්බන්ධයෙන් සේවා සඳහා වන ගාස්තුවට සමාන නමුත් එය වෙනත් ආකාරයකින් දැරිය නොහැකි අයට ප්‍රවේශය සැපයීම කෙරෙහි අවධානය යොමු කරයි	සෞඛ්‍යාරක්ෂාව (බෙහෙත් වට්ටෝරු, ඇස් කණ්ණාඩි), උපයෝගිතා වැඩසටහන්	නිර්මාණාත්මක බෙදා හැරීමේ පද්ධති, අඩු නිෂ්පාදන හා අලෙවිකරණ පිරිවැය, ඉහළ මෙහෙයුම් කාර්යක්ෂමතාව
සමුපකාරය Cooperative	සාමූහික සේවා තුළින් සාමාජිකයන්ට ප්‍රතිලාභ ලබා දෙයි	තොග මිලට ගැනීම, සාමූහික කේවල් කිරීම (වෘත්තීය සමිති), කෘෂිකාර්මික කෝප්, ණය සමිති	සාමාජිකයින්ට පොදු අවශ්‍යතා / අවශ්‍යතා ඇත, ප්‍රධාන පාර්ශවකරුවන් සහ ආයෝජකයින්
වෙළඳ පල සම්බන්ධතාවය Market linkage	සේවාදායකයින් සහ බාහිර වෙළඳපොළ අතර වෙළඳ සබඳතා සඳහා පහසුකම් සපයයි	සේවාදායකයින් සහ බාහිර වෙළඳපොළ අතර වෙළඳපොළ සබඳතා සඳහා පහසුකම් සපයයි.	සේවාදායකයින්ගේ නිෂ්පාදන විකුණන්නේ නැති නමුත් සේවාදායකයින් වෙළඳපොළට සම්බන්ධ කරයි
සේවා සහනාධාර Service subsidization	වෙනත් සමාජ වැඩසටහන් සඳහා අරමුදල් සැපයීම සඳහා නිෂ්පාදන හෝ සේවාවන් බාහිර වෙළඳපොළකට විකුණයි. මෙම ආකෘතිය ලාභ නොලබන සංවිධානය සමඟ ඒකාබද්ධ වී ඇත. ව්‍යාපාරික ක්‍රියාකාරකම් සහ සමාජ වැඩසටහන් ඒකාබද්ධව සිදුකරනු ලබයි.	උපදේශනය, රැකියා පුහුණුව, ලීසිං, මුද්‍රණ සේවා යනාදිය	ස්ථාවර වත්කම් (ගොඩනැගිලි, ඉඩම්, සේවකයින්) හෝ අස්පෘශ්‍ය (විශේෂ අවශ්‍යතා, ක්‍රමවේදයන් හෝ සබඳතා) උත්තේජනය කළ හැකිය.
සංවිධානාත්මක සහයෝගය Organizational support	සේවා සහනාධාරයට සමාන නමුත් බාහිර ආකෘතිය ව්‍යාපාරික ක්‍රියාකාරකම් සමාජ වැඩසටහන් වලින් වෙන් වේ	සේවා සහනාධාරයට සමානයි * එහි වත්කම් උත්තේජනය කරන ඕනෑම ආකාරයක ව්‍යාපාරයක්	සේවා සහනාධාරයට සමානය.
ව්‍යවසායක සහාය Entrepreneur support	එහි ඉලක්කගත ජනගහනයට ව්‍යාපාරික සහාය අලෙවි කරයි.	ක්ෂුද්‍ර මූල්‍ය සංවිධාන, උපදේශන හෝ තාක්ෂණික සහාය	ව්‍යවසායකයා සඳහා සුදුසු පුහුණුව
වෙළඳපොළ අතරමැදියා Market intermediary	ගනුදෙනුකරුවන්ට වෙළඳපල වෙත ප්‍රවේශ වීමට සේවා සැපයීම	සාධාරණ වෙළඳාම, කෘෂිකර්මාන්තය සහ හස්ත කර්මාන්ත සංවිධාන වැනි සමුපකාර	ආරම්භක පිරිවැය අඩු වීම, සේවාදායකයින්ට ඔවුන්ගේ ප්‍රජාව තුළ රැඳී සිටීමට සහ වැඩ කිරීමට ඉඩ සලසයි
රැකියා Employment	සේවාදායකයින්ට රැකියා අවස්ථා සහ රැකියා පුහුණුව ලබා දී එහි නිෂ්පාදන හෝ සේවාවන් විවෘත වෙළ්පොලේ අලෙවි කරයි	හු දර්ශන, කැෆේ, මුද්‍රණ හෝ වනත් ව්‍යාපාරවල රැකියා අවස්ථා සපයන ආබාධිත හෝ තරුණ සංවිධාන	රැකියා පුහුණුව යෝග්‍යතාවය සහ වාණිජමය ශක්‍යතාව
නොමිලේ සේවා Free-for-service	සමාජ සේවා කෙලින්ම සේවාදායකයින්ට තෙවන පාර්ශවයකට ගෙවන්නෙකුට විකිණීම	සාමාජික සංවිධාන, කෞතුකාගාර සහ සායන	ප්‍රතිලාභවලට වඩා සුදුසු ගාස්තු ව්‍යුහයක් ස්ථාපිත කිරීම

ඔබ සමාජ ව්‍යවසායයක් ආරම්භ කිරීමට පෙර සිතන්න - සමාජ ව්‍යවසාය ඔබට ගැලපෙනවාද?

ඔබ සමාජ ව්‍යවසායයක් ආරම්භ කිරීමට පෙර, ඔබට මුලින්ම සමාජ ව්‍යවසායයක් ආරම්භ කිරීමට අවශ්‍ය වන්නේ මන්දැයි සිතීම වැදගත් වන අතර එය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය දේ ඔබ සතුව තිබේ ද යන්න පිළිබඳව ඔබටම අවංක විය යුතුය. ඔබ තවදුරටත් ඉදිරියට යාමට පෙර සලකා බැලිය යුතු කරුණු කිහිපයක් පහත සඳහන් වේ.

සමාජ ව්‍යවසායක් ඔබට හෝ ඔබ සංවිධානයට අරමුදල් සොයා ගැනීමට මාර්ගයක් නොවේ. එසේම, එය විශාල ලාභයක් ද උත්පාදනය නොකරනු ඇත.

සමාජ ව්‍යවසායයන් සමාජමය වෙනසක් ඇති කළ හැකි එකම මාර්ගය නොවේ.

ව්‍යාපාරයක් පවත්වා ගෙන යාම හරහා ඔබ අවංකවම සමාජ ගැටලුවකට විසඳුමක් ලබාදීමට කැපවී සිටිනවාද යන්න සිතා බැලිය යුතුය.

සමාජ ව්‍යවසායක් පිහිටුවීමට විකල්ප හේතු තිබේ. වෙනසක් කිරීමට අවශ්‍ය ඔබේ අභිප්‍රේරණය (Motivation) පිළිබඳව සැලකිලිමත් වන්න.

සමාජ ව්‍යවසායක් පවත්වාගෙන යාම අධික වියදමක් සහ කාලයක් වැය වෙන කාර්යයකි. සාමාන්‍ය ව්‍යවසායකට වඩා පිරිවැයක් අවශ්‍ය වේ.

සමාජ ව්‍යවසායක් සැලසුම් කිරීමට සහ ආරම්භ කිරීමට බොහෝ කාලයක් ගතවේ. ඔබේ සමාජ ව්‍යවසාය එහි වියදම් පියවා ගැනීමට තවත් වසර තුනක් හෝ හතරක් ගතවනු ඇත. කෙටි මාර්ග නොමැත. දුෂ්කර කාලයක් ගත කිරීම සඳහා ඔබ සූදානම්ද?

වෙහෙස මහන්සි වී වැඩ කිරීම කිසි විටෙකත් නතර නොවේ.

ව්‍යාපාරයක්, විශේෂයෙන් සමාජ ව්‍යවසායක් පවත්වාගෙන යාම කාලයත් සමඟ පහසු නොවේ. තරඟකාරිත්වය ඉහළ යයි. නිෂ්පාදන පිරිවැය ඉහළ යයි, ප්‍රධාන කාර්ය මණ්ඩලය වෙනත් රැකියා කරා ගමන් කරයි, සැපයුම්කරුවන් වෙනත් ව්‍යාපාර සමඟ සම්බන්ධ වෙයි. ඔවුන්ගේ නිෂ්පාදන සඳහා වෙළඳපල වෙනස් වේ - ඔබ ඔබේ සමාජ ව්‍යවසාය සමග දිගු ගමනක් යාමට සූදානම්ද?

4 සමාජ ව්‍යවසායක් ආරම්භ කරන්නේ කෙසේද?

සමාජ ව්‍යවසායක් ආරම්භ කිරීම වෙනත් ව්‍යාපාරයක් ආරම්භ කරනවා හා සමානය. එය අභියෝගාත්මක මෙන්ම ප්‍රතිලාභ දායක වන අතර ඕනෑම කෙනෙකුට හෝ ඕනෑම සංවිධානයකට තම අනාගතය වෙනුවෙන් ගන්නා ඉතා වැදගත් තීරණයකි. එය පහසු කාර්යයක් නොවන අතර එය සරල ක්‍රියාවලියක් ලෙස නො සැලකිය යුතු ය. ඒ සඳහා කාලය, ප්‍රාග්ධනය, ශක්තිය, අධිෂ්ඨානය, ඉවසීම සහ ශක්තිමත් දිගු කාලීන කැපවීමක් අවශ්‍ය වේ.

පුද්ගලයන්ට සහ සංවිධානවලට සමාජ ව්‍යවසායක් ලෙස සාර්ථක වීමට අවශ්‍ය නම්, ඔවුන් අවදානම් මඟහැරීමෙන් සහ ප්‍රදාන සෙවීමෙන් බැහැරව සංකීර්ණ පරිවර්තන ක්‍රියාවලියක් අනුගමනය කළ යුතු අතර ශක්තිමත් ව්‍යවසායක මානසිකත්වයක් ඇතිකර ගත යුතු ය.

සමාජ ව්‍යවසායක් ආරම්භ කිරීමට කැමති ඕනෑම අයකුට සමාජ ව්‍යවසායක් ආරම්භ කිරීම පිළිබඳ ව මනා අවබෝධයක් සහ දැනුමක් තිබිය යුතු ය. මීට අමතරව, සමාජ ව්‍යවසායයන් සඳහා දැඩි ආශාවක් ඇති සහ ව්‍යාපාරය සහ මෙහෙවර සමතුලිත කළ හැකි ශක්තිමත් නායකත්වයක් අවශ්‍ය වේ.

හොඳ ව්‍යාපාර සැලැස්මක්, ප්‍රමාණවත් ආරම්භක අරමුදල්, උපදෙස් සහ සහාය අනෙකුත් වැදගත් පූර්ව අවශ්‍යතා වේ. සමාජ ව්‍යවසායයන් ඕනෑම කුඩා ව්‍යවසායකට සමාන බව සැලකිල්ලට ගැනීම වැදගත් ය. ඔවුන් උපයන ආදායමේ ප්‍රමාණය අනුව වෙනස් වන අතර පළමු වසර තුනේ සිට පහ දක්වා ලාභයක් ඉපයීමට අපහසු ය. මෙය මනසේ තබා ගෙන, සමාජ ව්‍යවසායක් පිහිටුවීමට කැමති ඕනෑම අයකු එවැනි ක්‍රියාකාරකමක් ආරම්භ කිරීමට පෙර අවශ්‍ය සැලසුම් සකස් කර ගත යුතු ය.

සමාජ ව්‍යවසායක් ආරම්භ කිරීමට පෙර යමෙක් ඔහුගෙන් හෝ ඇයගෙන් ම ඇසිය යුතු පළමු ප්‍රශ්නය වන්නේ "ඔබට සමාජ ව්‍යවසායක් පිහිටුවීමට අවශ්‍ය වන්නේ ඇයි?" යන්නයි. මෙය පළමු හා වැදගත් ම ප්‍රශ්නය විය යුතු ය. බොහෝ විට සමාජ ව්‍යවසාය අදහස මතුවන්නේ ව්‍යාපාරික අදහසක් තුළින් සමාජයට යම්කිසි සේවයක් කිරීමේ සහ සමාජයට ධනාත්මක බලපෑමක් ඇතිකිරීමේ අවශ්‍යතාවයක් මතය. ඕනෑම ආකාරයකින්, යහපතක් කිරීමට සහ ප්‍රජාවට උපකාර කිරීමට ඇති කැමැත්ත ව්‍යාපාරය පදනම් වී ඇති ආචාර ධර්ම විය යුතු ය.

සාමාන්‍යයෙන් එය පැන නගින්නේ පුද්ගලික අත්දැකීමකින්, ආශාවකින් හෝ හදවතට ඉතා සමීප හේතුවකිනි.

පුද්ගලයන් හෝ සංවිධාන සමාජ ව්‍යවසායයක් ආරම්භ කිරීම ගැන සිතීමට විවිධ හේතු තිබේ. ඒවා සම්පූර්ණයෙන්ම මූල්‍යමය සිට මෙහෙවර මත පදනම් වේ. බොහෝ විට, ඒවා මේ දෙකේ සම්මිශ්‍රණයකි. ඕනෑම ව්‍යාපාරයක් ආරම්භ කිරීමට ක්‍රම තුනක් ඇතඃ

- නිෂ්පාදනයක් හෝ සේවා අදහසක් තිබීම
- අවශ්‍යතාවයක් හෝ අතිරික්ත ආදායමක් ඇති විශේෂිතපාරිභෝගික කණ්ඩායමක් හඳුනාගෙන තිබීම
- ආයෝජනය කිරීමට මුදල්, කාලය හා අවස්ථාව තිබීම

ඉහත කාරණා තුනට අමතරව යම් සමාජ හෝ පාරිසරික ගැටලුවකට විසඳුමක් ලෙස සමාජ ව්‍යවසායක් ආරම්භ කිරීමට පෙළඹවීමද ප්‍රධාන හේතුවක් ලෙසද සඳහන් කල හැකිය. සමාජීය අරමුණු සඳහා සහාය වීමට සංවර්ධන ආධාර සඳහා අරමුදල් රැස් කිරීම සඳහා පුණ්‍යායතනයක් හෝ රාජ්‍ය නොවන සංවිධානයක් යම් වාණිජ ව්‍යාපාරයක් සමාජ ව්‍යාවසායයක් ලෙස ආරම්භ කරන ලද අවස්ථාවන් බොහොමයක් ඇත.

පොදුවේ ගත් කල, සමාජ ව්‍යවසායක් ආරම්භ කළ හැකි පොදු ප්‍රවේශ තුනක් තිබේ. මෙම ප්‍රවේශයන් එකිනෙකට වෙනස් විය හැකි නමුත් මූලික කරුණු බොහෝ සෙයින් සමාන වේ.

ගැටලු මත පදනම් වූ ප්‍රවේශය

මෙම ප්‍රවේශය තුළ, ව්‍යවසායකයින් සමාජ හෝ පාරිසරික ගැටලුවක් සහ එහි මූලික හේතු හඳුනා ගනී. ඉන් පසුව, එම ගැටලුව විසඳිය හැකි විසඳුම් හඳුනා ගෙන එම විසඳුම් අතරින් ව්‍යවසායක විසඳුම් බවට පරිවර්තනය කළ හැකි විසඳුම් මොනවාද යන්න ගවේෂණය කරයි. අවසාන වශයෙන්, නව්‍ය නිෂ්පාදනයක් හෝ සේවාවක් බවට පත් කළ හැකි විසඳුම මත ව්‍යවසාය ආරම්භ කරයි.

පවතින ව්‍යවසායක පරිවර්තනය පදනම් කරගත් ප්‍රවේශය

මෙම ප්‍රවේශය ව්‍යාපාරයක් කරන ව්‍යවසායකයින් විසින් තම ව්‍යාපාර මෙහෙයුම හරහා සමාජීය හෝ පාරිසරික ගැටලුවක් විසඳීම සඳහා ඔවුන්ගේ ව්‍යාපාර ආකෘතිය තම අවශ්‍යතාවය අනුව වෙනස් කිරීමක් නැතහොත් විවිධාංගීකරණය කිරීමක් කරයි. තම නිෂ්පාදන, සේවාව හෝ නිෂ්පාදන ක්‍රියාවලිය හඳුනා ගත් ගැටලුවට විසඳුම ලෙසට යොදා ගනියි.

ආයතනික පරිවර්තනය මත පදනම් වූ ප්‍රවේශය

මෙම ප්‍රවේශය බොහෝ විට ලාභ නො ලබන සංවිධාන හෝ ප්‍රජා හෝ සිවිල් සමාජ සංවිධාන විසින් බහුලව භාවිතා කරනු ලැබේ. සාමාන්‍යයෙන් සිදු වන්නේ හඳුනා ගෙන ඇති සමාජ හෝ පාරිසරික ගැටලුවක් විසඳීම සඳහා සංවිධානය විසින් ඔවුන් දැනටමත් භාවිතා කරන විසඳුමක් හෝ විසඳුම් හඳුනා ගෙන ඒවා ව්‍යවසායක විසඳුම් බවට පරිවර්තනය කිරීමයි. ඉන් පසුව ඔවුන් සමාජ ව්‍යවසායයක් ලෙස සංවිධාන ආකෘතියට අවශ්‍ය ලෙස වෙනස්කම් සිදු කරයි.

සමාජ ව්‍යවසාය පොදු ප්‍රවේශයන්

සමාජ හෝ පාරිසරික ගැටළුවක් පදනම් කරගත් ප්‍රවේශය

ගැටළුව
↓
නිදන්ගත හේතු
↓
විසඳුම්
↓
ව්‍යවසායකත්ව විසඳුම්

පවතින ව්‍යවසායක පරිවර්තනය පදනම් කරගත් ප්‍රවේශය

ගැටළුව
↓
නිදන්ගත හේතු
↓
නිදන්ගත හේතු විසඳිය හැකි විසඳුම්
↓
ව්‍යවසායකත්ව විසඳුම්

පවතින සංවිධානයක පරිවර්තනය පදනම් කරගත් ප්‍රවේශය

ගැටළුව
↓
නිදන්ගත හේතු
↓
විසඳුම්
↓
තම විසඳුම්
↓
ව්‍යවසායකත්ව විසඳුම්

සමාජ මෙහෙවර

"සමාජ ව්‍යවසාය අනෙකුත් ප්‍රධාන ව්‍යාපාරවලට වඩා වෙනස් කරන ප්‍රධානතම දෙය වන්නේ සමාජ මෙහෙවරයි."

සමාජ මෙහෙවර යනු ඔබ පිහිටුවන සමාජ ව්‍යවසායයේ ප්‍රධාන අරමුණ පවසන තවත් ආකාරයකි. එය වැදගත් වන්නේ එය සමාජ ව්‍යවසායන් සැලසුම් කිරීමටත්, ඒවා ක්‍රියාත්මක වන බවට වග බලා ගැනීමටත් සහ ඔවුන්ට අවශ්‍ය දේ සාක්ෂාත් කර ගන්නේද යන්න දැන ගැනීමටත් උපකාරී වන බැවිනි. හැකිතාක් මුදල් ඉපයීම ප්‍රධාන අරමුණ වන ප්‍රධාන ධාරාවේ ව්‍යාපාරවලින් සමාජ ව්‍යවසායන් වෙනස් කරන්නේ ද එයයි.

"අපගේ මෙහෙවර වන්නේ ආහාර ද්‍රව්‍ය අපතේ යාම අවම කිරීම සහ ආහාර පරිසර පද්ධතිය නවීකරණය කිරීමයි. තිරසාර බව ජනතාවගේ එදිනෙදා ජීවිතයේ කොටසක් බවට පත් කිරීම අපගේ අරමුණයි. අපි පලතුරු සහ එළවළු අංශයේ ක්‍රියාත්මක වන්නේ අතිරික්ත හෝ 'විරූපී නිෂ්පාදන' අපගේම සන්නාමගත නිෂ්පාදන සහ තිරසාර මූලාශ්‍ර සහිත භාණ්ඩ අලෙවි කිරීමෙනි."

UGLYFOOD
EAT SUSTAINABLY, FOR THE BETTER GOOD

Ugly Food, Singapore

"ස්වයං උපකාර, සමාජ වෙළඳාම සහ ව්‍යාපාරික විසඳුම් හරහා අවස්ථා නිර්මාණය කිරීම මගින් දරිද්‍රතාවය දුරු කිරීම"

THE BIG ISSUE

Big Issue, UK

"අපි ගොවීන්ගේ සහ ඔවුන්ගේ පවුල්වල ජීවිත වැඩිදියුණු කරමින් ඔවුන්ගේ අවශ්‍යතා වෙනුවෙන් පෙනී සිටිමු, එවිට අපි එක්ව තිරසාර හා සාධාරණ ලෝකයක් ගොඩනගමු. කොකෝවා ගොවීන්ගේ සම හිමිකාරීත්වය දරන එකම Fairtrade චොකලට් සමාගම අපියි."

Divine CHOCOLATE

Divine Chocolate, Ghana,UK

5 සමාජ ව්‍යවසායයක් ආරම්භ කිරීමේ පියවර

සමාජ ව්‍යවසායක් සැලසුම් කිරීම යනු අනාගතයේ දී ඔබ කොතැනක සිටිය යුතු ද යන්න සහ එහි යන්නේ කෙසේ ද යන්න සොයා බැලීමේ ක්‍රියාවලියයි. මෙම අත්පොත සමාජ ව්‍යාවසාය සැලසුම් ක්‍රියාවලිය, ව්‍යවසාය අදහස මූල්‍යමය වශයෙන් ශක්‍ය ද සහ සමාජීය හා පාරිසරික වශයෙන් වගකිව යුතු ද යන්න පරීක්ෂා කිරීමට භාවිතා කළ හැකි ය. තවද, ඔබගේ ව්‍යවසාය අදහස ක්‍රියාවට නැංවිය හැකි ද යන්න පරීක්ෂා කිරීමට ද හැකි ය. ව්‍යවසාය සැලසුම් කිරීමේ දී එය දියුණු කිරීමට සහ ව්‍යාපාර කළමනාකරණය පිළිබඳව ඉගෙන ගැනීමට කැමති සාමාජිකයින් පිරිසක් එක් කර ගැනීමේ මාර්ගයක් ලෙස ද භාවිතා කිරීමට ද පුළුවන. අවසාන වශයෙන් මනා ලෙස සැලසුම්කරණය කිරීමෙන් ආයෝජන සහ වෙනත් ආධාර සොයා ගැනීම සඳහා භාවිතා කළ හැකි ලේඛනයක් පිළියෙල කිරීම සඳහා තොරතුරු ලැබෙනු ඇත.

ඔබේ සමාජ ව්‍යවසායයේ සැලසුම් මූලික අදහස්වලින් සහ වඩාත් සම්පූර්ණ ව්‍යාපෘති සංකල්පයක් ගැන සිතන විට, එය පූර්ණ ක්‍රියාකාරී ව්‍යවසායයක් ලෙස අවධානය යොමු කළ හැකිය. එවිට ඔබ ඔබේ ව්‍යාපාර ආකෘතිය ගැන සිතීමට වැඩි වැඩියෙන් අවශ්‍ය වනු ඇත. සාමාන්‍යයෙන් ව්‍යාපාර ආකෘතියට ප්‍රධාන අංග තුනක් ඇත.

- **ඔබේ ප්‍රධාන අරමුණ (සමාජ බලපෑම) :** අරමුණු සහ සදාචාරාත්මක / දැක්ම, මෙහෙවර සහ ව්‍යාපාරික සහ සමාජ වටිනාකම්
- **ඔබේ උපාය මාර්ගය:** ඔබ කරන කාර්යය සමස්ථයක් ලෙස එකට ගැලපෙන ආකාරය සහ එය ඔබගේ අරමුණු ඉටුකර ගැනීමට උපකාර වන ආකාරය
- **ඔබ ලබා දෙන දේ:** ඔබ ඔබේ ගනුදෙනුකරුවන්ට සහ / හෝ ප්‍රතිලාභීන්ට ලබා දෙන්නේ කුමන නිෂ්පාදනයක් හෝ සේවාවක් ද?

සමාජ ව්‍යවසායයක් ආරම්භ කිරීම සම්බන්ධ සැලසුම් ක්‍රියාවලිය පහත අනුපිළිවෙළින් සිදුවේ. එය පියවරෙන් පියවර ප්‍රවේශයක් ලෙස සැලකිය හැකි ය.

සමාජ ව්‍යවසායයක් ආරම්භ කිරීමේ පියවරයන්



අභිප්‍රේරණය

සමාජ ව්‍යවසායක සාර්ථකත්වය සඳහා අභිප්‍රේරණය (Motivation) අත්‍යවශ්‍ය දෙයක් ලෙස සැලකේ. විවිධ ප්‍රකාශිත ලේඛන සහ සමාජ ව්‍යවසායකයන්ගේ උදාහරණ වලට අනුව, බොහෝ සමාජ ව්‍යවසායකයින් තමන්ගේ ම අත්දැකීම් වලින් අභිප්‍රේරණය වී ඇත. බොහෝ සමාජ ව්‍යවසායකයින් තම ප්‍රජාව තුළ මුණගැසෙන සමාජ ගැටලු සහ සපුරා නොමැති අවශ්‍යතා පිළිබඳ අවබෝධය සහ අත්දැකීම් මගින් අභිප්‍රේරණය වී ඇත.

ඔබ සමාජ ව්‍යවසායයක් දක්වා වර්ධනය වීමට බලාපොරොත්තු වන ආයතනයක් නම් උත්ප්‍රේරක සමාජ ව්‍යවසායකයෙකු සිටිය යුතුය. සාර්ථක සමාජ ව්‍යවසායන් ආරම්භ කරනු ලබන්නේ ඔවුන් කරන දෙයට ආශාවක් සහ කැමැත්තක් ඇති පුද්ගලයින් විසිනි.

සාර්ථක සමාජ ව්‍යවසායකයින් තම සිහිනය තනි තනිව සැබෑ කර ගත නොහැකි බව හඳුනා ගත්ත ද, ඔවුන් හා සම්බන්ධ වීමට අන් අයව පොළඹවන දැක්ම, අධිෂ්ඨානය, අවශ්‍ය සම්පත් සහ අභිප්‍රේරණය ඔවුන්ට තිබිය යුතු ය. සියල්ලටම වඩා, ඔවුන් එහි සිටින්නේ දිගු ගමනක් සඳහා මිස ඉක්මන් විසඳුමක් සඳහා නොවේ.

සමාජ ව්‍යවසායයක් ආරම්භ කිරීමේ අදහසින් ඔබ තව දුරටත් ඉදිරියට යාමට පෙර, ඔබ ඉදිරියෙහි ඇති මෙම දුෂ්කර ගමන සඳහා ඔබ සූදානම් විය යුතු අතර, නිසැකවම ඔබ ඉදිරියේ ඇති නොවැළැක්විය හැකි බාධක සහ අභියෝග ජය ගැනීමට ඔබ සම්පූර්ණයෙන්ම කැපවී සිටිය යුතු ය. එසේම, මෙම අවස්ථාවෙහි දී, ඔබ අදහස් ගවේෂණය එසේ නොමැති නම් අදහස් උත්තේජනය කිරීම වැදගත් වන අතර මෙය ඔබගේ අභිප්‍රේරණයට කොතරම් දුරට බලපාන්නේ දැයි බැලීම වැදගත් වේ. මෙහිදී, සමාජ ව්‍යවසායන් පිළිබඳව ඔබ දන්නා දේ ද ඉතා වැදගත් වේ.

පහත දැක්වෙන්නේ ඔබේ අභිප්‍රේරණය, ගුණාංග සහ වටිනාකම් ගැන සිතීමට උපකාර වන ප්‍රශ්නාවලියකි. ඔබ සමාජ ව්‍යවසායකයෙකු ලෙස ඔබේ ගමන ආරම්භ කිරීමට පෙර, ඔබ විසින් ම මෙම ප්‍රශ්න ඔබෙන් ම අසා ඒවාට සාධාරණ පිළිතුරු ඔබ සතුව ඇත් දැයි බැලීම අත්‍යවශ්‍ය වේ.

ඔබ සමාජ ව්‍යවසායක් ආරම්භ කිරීමට සූදානම්ද?

ඔබ සමාජ ව්‍යවසායයක් ආරම්භ කිරීමට ඔබ ව පොලඹවන්නේ කුමක් ද?.
ඔබට සමාජ ව්‍යවසායයක් ආරම්භ කිරීමට අවශ්‍ය ඇයි?
සමාජ ව්‍යවසාය ගැන ඔබට ප්‍රමාණවත් දැනුමක් තිබේ ද?
ඔබට හෝ ඔබේ සංවිධානය සමාජ ව්‍යවසායයක් ආරම්භ කිරීමට අදහස් කරන්නේ නම් ඒ වෙනුවට වෙනත් විකල්ප තිබේ ද?
ඔබට සාක්ෂාත් කර ගැනීමට අවශ්‍ය වන්නේ කුමක් ද?
ඔබේ පාර්ශවකරුවන් ඔබ සමඟ සිටින බව ඔබ සහතික කරන්නේ කෙසේ ද?
ඔබට හොඳ ව්‍යාපාරික අදහසක් තිබේ ද?
සමාජ ව්‍යවසායෙන් ප්‍රයෝජන ලැබෙන්නේ කාට ද?
ඔබට ඇත්තටම ව්‍යාපාරයක් කිරීමට අවශ්‍ය ද?
සාර්ථක වීමට අවශ්‍ය ශක්තිය සහ අධිෂ්ඨානය ඔබට තිබේ ද?
ව්‍යවසාය වර්ධනය කිරීමට සහ සංවර්ධනය කිරීමට අවශ්‍ය දිගුකාලීන කැපවීම සඳහා ඔබ සූදානම් ද?
ඔබ අවදානම සම්පූර්ණයෙන්ම තේරුම් ගන්නවා ද? නැතහොත් ඔබට හෝ ඔබේ සංවිධානයට සෘජුවම සම්බන්ධ වන අවදානම් මොනවා ද?
ඔබට පැහැදිලි සමාජ අරමුණු තිබේ ද නැතහොත් ඔබ විසඳීමට අදහස් කරන සමාජ ගැටළු සැබවින්ම ඔබ අවබෝධ කරගෙන තිබේ ද?

ව්‍යවසාය ජීවන අවධීන්



ඔබ විසඳීමට බලාපොරොත්තු වන ගැටලුව හොඳින් හඳුනා ගැනීම, නිර්වචනය කිරීම සහ ඔබේ විසඳුම

ඔබ සමාජ ව්‍යවසායයක් ආරම්භ කිරීමට අදහස් කරන්නේ නම්, එය පැහැදිලිවම ඔබ විසින් හඳුනාගත් සමාජ හෝ පාරිසරික ගැටලුවක් විසඳීමට ඔබ තුළ ඇති ආශාව නිසා ඔබ පෙලඹී ඇති බව උපකල්පනය කළ හැකිය. එබැවින්, ඔබේ සමාජ ව්‍යවසාය සැලසුම් කිරීම සඳහා, එය ක්‍රියාත්මක කරන්නේ කෙසේද යන්න පිළිබඳව ඔබට පැහැදිලි අදහසක් තිබිය යුතුය. එසේ කිරීම සඳහා, ඔබට ඔබ විසඳීමට බලාපොරොත්තු වන ගැටලුව, ඔබට ගෙන ඒමට අවශ්‍ය වෙනස සහ අවශ්‍ය ක්‍රියාමාර්ග පිළිබඳව වැඩිදුර ගවේෂණය කිරීමට අවශ්‍ය වනු ඇත. මෙහිදී, ඔබ ගවේෂණය කළ යුතු වැදගත් මූලික කරුණු 3ක් ඇත.

1. ගැටලුවේ න්‍යාය - Theory of Problem

- ඔබ විසඳීමට උත්සාහ කරන ගැටලුව කුමක්ද?
- මෙම ගැටලුවට මුහුණ දෙන්නේ කවුද සහ ඔවුන්ගේ අත්දැකීම් මොනවාද?
- ගැටලුවේ පරිමාණය කුමක්ද?
- මෙම ගැටලුව පවතින්නේ ඇයි?
- ඔබ හඳුනාගෙන ඇති ගැටලුවේ වත්මන් තත්ත්වය කුමක්ද?

2. ඇතිකිරීමට යන වෙනසේ හෝ වෙනස් වීමේ න්‍යාය - Theory of Change

- ඉහත අර්ථ දක්වා ඇති ගැටලුව විසඳීම සඳහා ඔබේ උපාය මාර්ගය
- ‘වෙනස් වීමේ න්‍යාය’ ක්‍රියාවලියේ අරමුණ වන්නේ ඔබ ආමන්ත්‍රණය කිරීමට සූදානම් වන ගැටලුවේ මූල හේතු වටා ගොඩනැගුණු ශක්තිමත් විසඳුම් උපාය මාර්ගයක් වර්ධනය කිරීමට ඔබට උපකාර කිරීමයි.

3. ක්‍රියාවේ න්‍යාය - Theory of Action

- ප්‍රධාන මැදිහත්වීම් (ඔබේ ක්‍රියා/මෙහෙයුම්), වෙනස් කිරීමේ විසඳුමේ න්‍යාය ක්‍රියාත්මක කිරීමට උපකාරී වේ.

ගැටලුවේ න්‍යාය පිළිබඳ උදාහරණයක්

වර්තමාන තත්වය	ඉලක්ක තත්ත්වය
දිළිඳු සහ ආන්තික ප්‍රජාවන්හි ආබාධිත පුද්ගලයන්, විශේෂයෙන්ම ආබාධිත කාන්තාවන් සාමාජීය වශයෙන් කොන් වීමට ලක් වී ඇත. එමනිසා ඔවුන්ගේ මානසික හා කායික සෞඛ්‍ය සහ පවුලේ යහපැවැත්ම පිරිහීමට ලක්වෙයි.	ආබාධිත කාන්තාවන් සමාජීය සහ ආර්ථික වශයෙන් ක්‍රියාකාරී වන අතර පවුල් සෞඛ්‍ය සහ යහපැවැත්ම ධනාත්මක වේ.

මෙම ගැටලුව අත්විඳින්නේ කවුද?	ගැටලුවේ පරිමාණය කුමක්ද?	මෙම ගැටලුව පවතින්නේ ඇයි?
ආබාධිත කාන්තාවන්, ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්,	ආබාධිත කාන්තාවන් සංඛ්‍යාව පවුල් සහ යැපෙන්නන් සංඛ්‍යාව	දුප්පත්කම සහ අඩු ආදායම් තත්ත්ව, අධ්‍යාපනය නොමැතිකම රැකියා නිපුණතා නොමැතිකම, සමාජ හා සංස්කෘතික බාධක දුර්වල පොදු සේවාවන් හෝ සේවාවන් වෙත ප්‍රවේශ වීමට නොහැකි වීම

සමාජ අරමුණු පිහිටුවීම

- ඔබේ සහ සමාජ ව්‍යවසායයේ සමාජ අරමුණු මොනවාද?
- වෙළඳපලේ සහ සමස්ත සමාජය තුළ ව්‍යවසාය ආමන්ත්‍රණය කළ යුතු අවශ්‍යතා මොනවාද?
- මෙම ව්‍යවසාය පුරවන්නේ වෙළඳපලේ කුමන හිඩැසක්ද?
- ව්‍යවසාය හරහා ඔබට අත්කර ගැනීමට අවශ්‍ය සමාජ ප්‍රතිඵල මොනවාද සහ කවුරුන් සඳහාද?
- සමාජ ප්‍රතිඵල ඔබේ සමාජ අරමුණු සමඟ සෘජුවම සම්බන්ධද?
- මෙම ඔබේ අරමුණු සාක්ෂාත් කර ගෙන ඇති බව ඔබ දන්නේ කෙසේ ද? ඔබගේ ජයග්‍රහණ පෙන්නුම් කරන සාර්ථක දර්ශක මොනවාද?
- මෙම සමාජ ප්‍රතිඵල ඔබේ සංවිධානයේ සමාජ මෙහෙවරට සම්බන්ධ වන්නේ කෙසේ ද?

ඇතිකිරීමට යන වෙනසේ හෝ වෙනස් වීමේ න්‍යාය Theory of Change

වෙනස් වීමේ න්‍යාය යනු සමාජ ව්‍යවසායකත්ව වෘත්තිකයන් අතර සමාජයේ අපේක්ෂිත ධනාත්මක වෙනසක් ඇති කිරීමට ඔවුන් ගෙන යන පියවරයන් සිතියම්ගත කිරීම සඳහා බහුලව භාවිතා වන මෙවලමකි. මෙය මාර්ග සිතියමක් ලෙස හෝ තමන් කැමති සමාජ ගැටළුවක් විසඳීම සඳහා පිළිගත හැකි සහ තිරසාර විසඳුමක් ලෙස භාවිතා කළ හැක.



සූදානම් වීම

මෙම අදියර වන විට ඔබ මෙම සමාජ ව්‍යවසාය ආරම්භ කිරීම සඳහා ඔබ අභිප්‍රේරණය වී ඇතිදැයි ඔබ දැනටමත් හඳුනාගෙන ඇත. සමාජ ව්‍යවසාය යනු කුමක් ද යන්න පිළිබඳ ව ඔබට යම් අවබෝධයක් තිබිය යුතු අතර ඔබට ගවේෂණය කිරීමට අවශ්‍ය ව්‍යාපාරික අදහසක් සිතේ තිබිය යුතුය. ව්‍යාපාර සංවර්ධන ක්‍රියාවලියේ තීරණාත්මක මූලධර්මයක් වන්නේ ඔබ කළ හෝ ඉගෙන ගත් දේ අඛණ්ඩව සමාලෝචනය කිරීමයි. අවශ්‍ය නම්, ඔබේ සමාජ ව්‍යවසාය සංවර්ධනය කරන්නේ කෙසේ ද යන්න නැවත තක්සේරු කිරීමට ඔබට පියවරක් පසුපසට ගැනීමට සිදුවනු ඇත. එමෙන්ම සමාජ ව්‍යවසායක් පවත්වාගෙන යාමට ඔබේ කුසලතා සහ හැකියාව තක්සේරු කිරීම ද වැදගත් වේ. ඔබට හෝ ඔබේ සංවිධානයට සිදුවිය හැකි වෙනස්කම් ගැන අවධානය යොමුකිරීම අවශ්‍යවන අතරම අවදානම පිළිබඳව ඔබේ ආකල්පය සහ ව්‍යාපාරය වර්ධනය කිරීම සඳහා ඔබගේ මූල්‍ය සූදානම පිළිබඳව ද යම් තක්සේරුවක් කිරීමද වැදගත් වේ. මේ අතර ඔබේ පාර්ශවකරුවන් හඳුනාගෙන විශ්ලේෂණය කිරීම ද වැදගත් වේ.

පුද්ගලයෙකු හෝ සංවිධානයක් ලෙස ඔබේ ව්‍යවසායකත්ව සූදානම තක්සේරු කිරීම සඳහා, ඔබට පහත ප්‍රශ්න ඔබ විසින්ම ඇසිය හැකි අතර ඔබ සමාජ ව්‍යවසායයක් ආරම්භ කිරීමට සූදානම්ද යන්න තීරණය කළ හැක.

> **"ආරම්භක ව්‍යවසායයන් සියල්ලම එකම, පුරෝකථනය කළ හැකි මාර්ග අනුගමනය නොකරයි, නමුත් ඒවා සමාන අදියර කරා ළඟා විය යුතුය. ආරම්භක සූදානම පරීක්ෂණය යනු එයයි. ආරම්භක සූදාන්ම් පරීක්‍ෂණය තමන්ගේ ව්‍යවසායකත්ව හැකියාවන් සහ ව්‍යවසායකත්ව ගුණාංග දෙස විමර්ශනාත්මකව බැලීමට මාර්ගෝපදේශයක් සපයයි.සාර්ථකත්වය කරා විවිධ අදියරයන් හරහා ආරම්භක ව්‍යවසායක ප්‍රගතිය නිරීක්ෂණය කළ හැකිය."**

ව්‍යවසායක සූදානම් පරීක්ෂණය

	ඔව්	නැත	අදහසක් නැත
ඔබ ව්‍යාපාරයක් ආරම්භ කිරීමට සූදානම් යැයි සිතනවාද?			
ඔබේ ව්‍යාපාරයට ඔබේ පවුලේ අයගෙන් සහ මිතුරන්ගේ සහය තිබේද?			
ඔබ ආරම්භ කරන දෙයට සමාන ව්‍යාපාරයක ඔබ කවදා හෝ වැඩ කර තිබේද?			
ඔබ ව්‍යවසායකයෙකු යැයි ඔබ දන්නා අය පිළිගන්නවාද?			
කුඩා ව්‍යාපාර පාඨමාලාවක් හෝ සම්මන්ත්‍රණයකට සහභාගි වී තිබේද?			
ඔබ ඔබේම තීරණ ගන්න කැමතිද?			
තීරණ ගැනීමට උදව් සඳහා අන්අය වෙත යොමුවනවාද?			
ඔබ තරඟයට කැමතිද?			
ඔබට බලය හා ස්වයංවිනය තිබේද?			
ඔබ යමක් කිරීමට පෙර සැලසුම් කරනවාද?			
ඔබට අන් අය කැමතිද?			
ඔබ අන් අය සමඟ සම්බන්ධකම් පවත්වනවාද?			
ඔබ සමාජශීලී බව ඔබ දන්නා අය පවසයිද?			
ඔබේම ව්‍යාපාරයක් පවත්වා ගෙනයාමට දිනකට පැය 12කට වඩා වැඩ කිරීමට,සහ ඉරිදා දිනවල සහ නිවාඩු දිනවල වැඩ කිරීමට අවශ්‍ය බව ඔබ දන්නවාද?			
ඵලදායි ලෙස කටයුතු කිරීමට ඔබට චිත්ත ශක්තිය තිබේද?			
ඔබේ ව්‍යාපාරය ස්ථිර ලෙස ස්ථාපිත වන තෙක් ඔබේ එදිනෙදා කටයුතු මදක් නැවැත්වීමට ඔබ සූදානම් ද?			
ඔබේ ඉතුරුම් වලින් කොටසක් ව්‍යාපාරය සඳහා භාවිතා කිරීමට ඔබ සූදානම්ද?			
සාර්ථක ව්‍යාපාරයක් පවත්වාගැනීම සඳහා ඔබට අවශ්‍ය මූලික කුසලතා පිළිබඳව ඔබ දන්නවාද?			
ඔබට එම කුසලතා තිබේද?			
ඔබට පරිගණක දැනුම තිබේද?			
ඔබ කවදා හෝ කළමනාකරණ හෝ අධීක්ෂණය කටයුතු වල සේවය කර තිබේද?			
සේවකයන් බඳවාගැනීම, කාර්යයන් පැවරීම සහ විනය පවත්වාගෙන යාම ඔබට පහසු යැයි සිතනවාද?			
ඔබේම ව්‍යාපාරයට අවශ්‍ය මූලික කුසලතා ඔබ සතුව නොමැති බව ඔබ සොයා ගත්තේ නම්, අවශ්‍ය නිපුණතා ලබාගන්නා තෙක් ඔබේ සැලසුම ප්‍රමාද කිරීමට ඔබ කැමතිද?			

සංවිධාන ව්‍යවසායක සූදානම පරීක්ෂණය

ඔබේ සංවිධානයේ මූලික සාරධර්ම මොනවා ද?

ඔබේ සංවිධානයේ අරමුණ කුමක් ද?

ඔබගේ වර්තමාන ක්‍රියාකාරකම් මොනවා ද සහ ඒවා ක්‍රියාත්මක කිරීමේදී ඔබ කෙතරම් සාර්ථක ද?

ව්‍යාපාරයක් පවත්වාගෙන යාමට අවශ්‍ය ආයතනය තුළ ඔබට කුසලතා සහ අත්දැකීම් පරාසයක් තිබේ ද?

ඔබ සංවිධානයට උපාය මාර්ගයක් තිබේ ද සහ සමාජ ව්‍යවසායක් සංවර්ධනය කිරීම මෙයට ගැලපෙන්නේ කෙසේද?

ඔබේ සංවිධානය වෙනස්වීම්වලට ප්‍රතිචාර දක්වන්නේ කෙසේද?

ඔබ පවතින ක්‍රියාකාරකම් ඇගයීම සහ නව වර්ධනයන් සඳහා සැලසුම් කරන්නේ කෙසේද?

සමාජ ව්‍යවසායයක් බවට පත්වීමට අවශ්‍ය වෙනස්කම් සිදුකිරීමට පාලක මණ්ඩලය සහ ප්‍රධාන කාර්ය මණ්ඩලය සහාය දෙනවාද?

සමාජ ව්‍යවසායයක් බවට පත්වීමට සහය වීම සඳහා ඔබට සංවර්ධනය කිරීමට හෝ වෙනස් කිරීමට අවශ්‍ය ප්‍රතිපත්ති, ක්‍රියා පටිපාටි සහ පද්ධති පිළිබඳව හොඳ අවබෝධයක් තිබේද?

පාර්ශවකරු විශ්ලේෂණය

පාර්ශ්වකරු විශ්ලේෂණය (Stakeholder Analysis) යන්නෙන් අදහස් වන්නේ ඔබේ සමාජ ව්‍යවසායයට කිසියම් සම්බන්ධයක් හෝ බලපෑමක් ඇති සියලුම පුද්ගලයන් සහ සංවිධාන හඳුනා ගැනීමයි. ඔබේ පාර්ශවකරුවන් කවුරුන්දැයි ඔබ දන්නේ නම්, එය ඔබේ සමාජ ව්‍යවසායයේ සංවර්ධනය සැලසුම් කිරීමට උපකාරී වේ. හවුල්කරුවන් සහ ගනුදෙනුකරුවන් සමඟ සම්බන්ධ වීමේ හොඳම ආකාරය තේරුම් ගැනීමටද එය ඔබට උපකාර කරයි. සමාජ ව්‍යවසායන්ට පාර්ශවකරුවන් සහ ගනුදෙනුකරුවන් යන දෙගොල්ලන්ම සිටිය හැකිය. පාර්ශවකරුවන් සමඟ හොඳ ව්‍යාපාරික සබඳතා ඇති කර ගැනීමට සහ හොඳම නිෂ්පාදනයක් හෝ සේවාවක් අවබෝධකර සැපයීම සඳහා ඔවුන්ගේ ගනුදෙනුකරුවන් කවුරුන්ද යන්න දැන ගැනීම සඳහා ඔවුන් කවුරුන්ද යන්න දැන ගැනීම වැදගත් වේ.

ප්‍රධාන වශයෙන් පාර්ශවකරුවන් වර්ග තුනකට අයත් වේ.

1. ප්‍රාථමික පාර්ශ්වකරුවන්

තම අභිලාෂයන් සමාජ ව්‍යවසායයේ කේන්ද්‍රයේ ඇති අයයි. මෙම කණ්ඩායම් සමහර විට ඉලක්ක කණ්ඩායම හෝ ප්‍රධාන පාරිභෝගිකයන් ලෙස හැඳින්වේ. ඔවුන් සාමාන්‍යයෙන් සාමාජිකයින්, සේවා භාවිතා කරන්නන්, වැදගත් වෙළඳ හවුල්කරුවන් හා ස්වේච්ඡා සේවකයන් වේ.

2. ද්විතීයික පාර්ශවකරුවන්

ප්‍රාථමික පාර්ශවකරුවන් වෙත ළඟා වීම සඳහා සමාජ ව්‍යවසාය සමඟ සහයෝගයෙන් කටයුතු කරන අයයි. ඔවුන් සාමාන්‍යයෙන් සැපයුම්කරුවන්, බැංකු, හවුල්කරුවන්, රාජ්‍ය හා පෞද්ගලික අංශයේ සංවිධාන සහ තරඟකරුවන් වේ.

3. තෘතියික පාර්ශවකරුවන්

වෙළඳ හවුල්කරුවන්, මූල්‍ය ආයතන සහ බාහිර උපදේශකයින් වේ. මෙම වර්ගය කුඩා කණ්ඩායම් සඳහා අදාළ නොවනු ඇත, නමුත් විශාල සමාජ ව්‍යවසායන් සඳහා මෙය වැදගත් කණ්ඩායමක් විය හැක.

පාර්ශවකරු විශ්ලේෂණයක් කරන්නේ කෙසේද යන්න පිළිබඳ උදාහරණයක් පහත දැක්වේ.

- ඔබේ ප්‍රධාන පාර්ශවකරුවන් ඔවුන්ගේ වැදගත් කම අනුව ප්‍රමුඛතා ගත කරන්න. මෙයට ගනුදෙනුකරුවන්, අරමුදල් සපයන්නන්, ස්වේච්ඡා සේවකයන්, සේවා භාවිතා කරන්නන්, සාමාජිකයින්, කාර්ය මණ්ඩලය යනාදිය ඇතුළත් විය හැකිය.
- ඔබේ ව්‍යාපාරයට ඉහළ මට්ටමේ බලපෑමක් ඇති කිරීමට ඉඩ ඇති පාර්ශවකරුවන් හඳුනාගන්න.
- ඔබ ලැයිස්තුගත කර ඇති පාර්ශවකරුවන් සමග ඔබ සම්බන්ධ වන්නේ කෙසේදැයි හඳුනාගන්න.

පාර්ශවකරුවන් සිතියම්ගත කිරීම

සම්බන්ධතා සිතියම් ගතකිරීම තුළින් ඔබට බලපෑම් කළහැකි ප්‍රධාන පුද්ගලයින් හෝ ආයතන හඳුනා ගැනීමට ඉඩ දෙයි. ඔබේ පාරිභෝකයන්ගේ අවශ්‍යතා සහ වෙළඳපලේ හිදැස් හඳුනාගැනීමට මෙම මෙවලම ඔබට උපකාරී වේ.

6 සමාජ ව්‍යවසාය අදහස් ජනනය කිරීම, තෝරා බේරා ගැනීම සහ ඇගයීම

ඇත්ත වශයෙන්ම, සමාජ ව්‍යවසායකත්ව අදහස් “ත්‍රිත්ව පහළ රේඛාව” (Triple Bottom Line) යන ආකෘතිය සමග බැඳී ඇත. එය සාම්ප්‍රදායික ලාභ, ආයෝජන මත ප්‍රතිලාභ සහ කොටස් හිමියන්ගේ වටිනාකම යන සාම්ප්‍රදායික මිනුම්වලින් ඔබ්බට ගොස් පාරිසරික හා සාමාජීය කාරණා අන්තර්ගත වී ඇත.

“ත්‍රිත්ව පහළ රේඛාව” යනු සුප්‍රකට ව්‍යවසායකයෙකු වන John Elkington විසින් නිර්මාණය කරන ලද සංකල්පයක් වන අතර, ව්‍යාපාර ශේෂ පත්‍රයක් ඩොලර් වලින් ඔබ්බට විහිදිය යුතු බවත් එය පහත සඳහන් ප්‍රධාන කොටස් තුන කෙරෙහි අවධානය යොමු යුතු බවත් පැවසීය, එනම්:

- මිනිසුන් People
- ලෝකය Planet
- ලාභය Profit

අදහස් ජනනය කිරීම

බොහෝ දෙනා අතර තිබෙන වැරදි මතයක් වන්නේ අපට ව්‍යාපාරික අදහස් පැමිණෙන්නේ ක්ෂණිකව හෝ වසර ගණනාවක් තිස්සේ ඒ පිළිබඳව කල්පනා කිරීමෙන් පසුව බවයි.

සමාජ ව්‍යවසාය අදහස ඕනෑම තැනක සිට පැමිණිය හැකි නමුත් සමාජ ව්‍යවසාය අදහස් ජනනය කිරීම සඳහා ප්‍රධාන මාර්ග දෙකක් ඇත.

- වාණිජමය ව්‍යාපාරික අදහසක් ලෙස
- සමාජ හෝ පාරිසරික ගැටලුවකට ව්‍යවසායක විසඳුමක් ලෙස

බොහෝ විට ඉහත කී කාරණා ඉතා හොඳින් එක්ව ක්‍රියා කරයි. උදාහරණයක් ලෙස සමාජ ව්‍යවසායක් ලාභ බෙදා හැරීම හරහා සමාජ ගැටලු විසඳීමට සහය විය හැක. ඒ අතරම රාජ්‍ය ආයතනයක් විසින් මහජනතාවට නොමිලයේ සේවා සැපයීම සඳහා සමාජ ව්‍යවසායයක් සමග ගිවිසුම් ගත විය හැක. තවද සමාජ හෝ පාරිසරික අරමුණු මත ක්‍රියාකරන ව්‍යවසායයන් පිහිටුවීමට රජය විසින් අවශ්‍ය සහාය ලබා දිය හැක.

හඳුනාගත් සමාජ හෝ පාරිසරික ගැටලුව විසඳීම සඳහා නව අදහස් උත්පාදනය කිරීම සමාජ ව්‍යවසායකයා සතු වගකීමකි. යම් හෙයකින් කිසියම් විශේෂිත ගැටලුවක් විසඳීමට නිවැරදි මාර්ගයක් නොමැති වුවත්, ගැටලුව නිර්මාණාත්මකව ලෙස විසඳන්නේ කෙසේද යන්න පිළිබඳ ක්‍රමානුකූල චින්තන ක්‍රියාවලියක (systematic thinking process) යෙදීම වඩා වැදගත් වේ.

ව්‍යවසාය අදහස් ජනිත කිරීමේදී සැලකිය යුතු කරුණු කිහිපයක් ඇත. ඔබ ජනිත කරන අදහස් ලියා තැබීමට ඉතාම වැදගත් ය. ඔබ දකින සිහින අනාගතයේ විශාල වෙනසක් සඳහා හොඳ ප්‍රවේශයක් විය හැක. එබැවින් පහත සඳහන් කාරණා ඔබට අදහස් ජනිත කිරීමේ ක්‍රියාවලියට වැදගත් වනු ඇත.

ඔබට වැඩිදියුණු කිරීමට හෝ වෙනස් කිරීමට අවශ්‍ය දෙය කුමක්ද?

එය වැඩිදියුණු කළ යුත්තේ ඇයි? - වැඩි දියුණු කිරීමෙන් ප්‍රතිලාභ ලබන්නේ කවුද?

මේ මොහොතේ එහි ඇති වරද හෝ අඩුපාඩුව කුමක් ද?

අන් අය අසමත් වූ තැන ඔබ සාර්ථක වන්නේ ඇයි?

එය වැඩිදියුණු කිරීමට ඔබ යෝජනා කරන්නේ කෙසේ ද?

එය වැඩිදියුණු කිරීමට අවශ්‍ය කාර්යය කිරීමට ඔබට දැනුමක් තිබේ ද?

එසේ නොවේ නම්, ඔබට උපකාර ලබා ගත හැකි ද? ඔබට උදව් කළ හැක්කේ කාටද?

එය වෙනත් දෙයක් සමඟ ඒකාබද්ධ කළ හැකිද?

හොඳ පාර්ශවකරුවන් පිරිසක් ගොඩනගා ගත හැකිද?

අදහස් පුනීලය

අදහස් පුනීලය (Idea Funnel) යනු අදහස්වල ශක්‍යතාව සඳහා පරීක්ෂා කළ හැකි නිරන්තර අදහස් ප්‍රවාහයක් සක්‍රීය කරන යාන්ත්‍රණයකි. අදහස් පුනීලයයේ මූලිකම දෙය නම් හැකිතාක් අදහස් ජනනය කිරීම සහ පසුව බොහෝ අදහස් වලින් අදහස් කිහිපයක් තෝරා ගැනීමයි. හොඳම අදහස් පවතිනු ඇති බැවින්, නව්‍ය අදහස්වලට ප්‍රමුඛත්වය දීමට සහ හොඳම අදහස් සම්පූර්ණයෙන්ම සංවර්ධනය කිරීමට හෝ වෙනත් නවෝත්පාදන දියත් කිරීමට හැකි බව සහතික කිරීමට අදහස් පුනීලය විශිෂ්ට මෙවලමකි.

ව්‍යාපාර අදහස් වල සුදුසු නුසුදුසු බව මැන බැලීමේදී පළමු පියවර ලෙස පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු සැපයීමෙන් ව්‍යාපාර අදහස් හෝ සංකල්ප පිළිබඳව මනා අවබෝධයක් ලැබීමට උපකාරී වනු ඇත. ප්‍රශ්නවලට ලැබෙන පිළිතුරු ප්‍රමාණවත් නොවේ නම් ව්‍යාපාර අදහස් හෝ සංකල්ප පිළිබඳව තවදුරටත් හොඳින් අධ්‍යයනය කළ යුතු ය.

ඔබේ භාණ්ඩය/සේවාව සඳහා සැබෑ අවශ්‍යතාවයක් තිබේද?

ලාභදායී ව්‍යාපාරයක් පවත්වාගෙන යාමට සරිලන ඉල්ලුමක් ඔබගේ නිෂ්පාදනයට/සේවාවට තිබේද ?

තරගකරුවන් දැනට සමාන නිෂ්පාදන/සේවා සපයන්නේද? 'ඔව්' නම්, ඔබේ ව්‍යාපාර අදහසින් පාරිභෝගිකයාට ඔබගේ තරගකරුවන්ගෙන් නොලැබෙන ප්‍රතිලාභ ලැබේද? නිෂ්පාදනය/සේවාව පහසුවෙන් නිෂ්පාදනය කළ හැකිද?

භාණ්ඩය/සේවාව නීත්‍යානුකූලද? එය ආරක්ෂිත ද?

භාණ්ඩය/සේවාව කල් පවතී නම්, එය පහසුවෙන් නඩත්තු සේවා කළ හැකිද? (එම නඩත්තු සේවය කරන්නේ කවුද?)

ඔබේ නිෂ්පාදනය (භාණ්ඩය හෝ සේවාව) සාර්ථක ලෙස සංවර්ධනය කිරීමට අවශ්‍ය මූල්‍ය ස්ථාවරත්වයක් ඔබට තිබේද? භාණ්ඩය හෝ සේවාව නිෂ්පාදනය කිරීමට සහ අලෙවි කිරීමට අවශ්‍ය මූල්‍ය සම්පත් ඔබ සතුව තිබේද?

ඔබට ව්‍යාපාරයේ සාර්ථකව රැඳී සිටීමට හැකිවන ලෙස ආපසු ගෙවීමේ කාලය (Payback Period) කෙටි කාලයක් තුළ ළඟා කරගත හැකිද?

ඔබගේ මුල් නිෂ්පාදනය හෝ සේවාව සාර්ථක වූවානම්, ඉන් පසුව එය තවදුරටත් සමාන හෝ ගැලපෙන වෙනත් නිෂ්පාදන පෙලක් දක්වා වර්ධනය කළ හැකිද?

ඔබට පේටන්ට් බලපත්‍රයක් හෝ ප්‍රකාශන හිමිකමක් සමග නිෂ්පාදනය ආරක්ෂා කළ හැකිද?

නිෂ්පාදනය වෙනත් කෙනෙකුගේ පේටන්ට් බලපත්‍ර හෝ ප්‍රකාශන හිමිකම් උල්ලංඝනය කරයිද?

අවශ්‍ය සියලුම අමුද්‍රව්‍ය සහ සැපයුම් පහසුවෙන් ලබා ගත හැකිද?



අදහස් ඇගයීම

අදහස් උත්පාදන අවධියේ දී, අදහස් කිහිපයකින් හොඳම අදහස් දෙකක් හෝ තුනක් තෝරාගෙන ඇති අතර දැන් එක් වඩාත් සුදුසු අදහසක් තෝරාගත යුතුය. වඩාත් සුදුසු අදහස තෝරා ගැනීමේදී තෝරාගත් අදහස් දෙක හෝ තුන විශේෂ ඇගයීමකට ලක් කළ යුතුව ඇත. ඉන් අනතුරුව තෝරාගත් අවසන් අදහස ක්‍රම කිහිපයක් භාවිතා කිරීමෙන් එම අදහසේ ශක්‍යතාවය සනාථ කරගත හැකි වෙනු ඇත. හොඳම අදහස්වල ශක්‍යතාව තක්සේරු කිරීම සඳහා ඊළඟ පිටුවේ දක්වා ඇති ක්‍රමවේද සටහන උපයෝගී කරගත හැක.

ව්‍යාපාරික අදහස ඇගයීමේදී, අවශ්‍ය තොරතුරු රැස් කිරීමට සහ විශ්ලේෂණය කිරීමට සහ ඒවා භාවිතා කිරීමෙන් නිවැරදි තීරණ ගැනීමට යම් කාලයක් ගත කළ යුතු ය. අවශ්‍ය නම් මේ සඳහා ව්‍යාපාර උපදේශකයන්ගේ සහාය ලබාගත හැක.

සමාජ හා ආර්ථික සාධක විශ්ලේෂණය කිරීමෙන් අවසාන අදහස් තෝරා ගැනීම
Final idea selection by analysing social and economic factors

ව්‍යාපාර අදහස	ඇගයීමේ නිර්ණායක								ලකුණු
	ආර්ථික සාධක				සමාජ සාධක				
	වෙළඳ පල ශක්‍යතාවය	සම්පත් සුලබතාවය	ලාබදායිතාවය	අවදානම් කළමණාකරණ හැකියාව	ප්‍රතිලාභීන් සංඛ්‍යාව	දිගුකාලීන පැවැත්ම	රැකියා සංඛ්‍යාව	පරිසර හිතකාමී බව	

ලකුණු ලබා දීම : 5 විශිෂ්ටයි 4 ඉතා හොඳයි 3 හොඳයි 2 සාමාන්‍යයි 1 දුර්වලයි

